# සීමාසහිත කාගිල්ස් බැංකුව

## CARGILS BANK LIMITED

# වෙළෙඳසැල් හිමියන් (වාණිජකරුවන්) සඳහා වන ගිවිසුම

## Merchant Agreement

සීමාසහිත කාගිල්ස් බැංකුව (Cargils Bank Limited)
කාඩ්පත් මධ්‍යස්ථානය,
අංක 34,
මේට්ලන්ඩ් චන්ද්‍රවංකය,
කොළඹ 07.
ශ්‍රී ලංකාව.

මෙම ගිවිසුම වර්ෂ ---------------- වූ --------------- මස ------------- (දිනය අකුරින්) ---------------- (දිනය ඉලක්කමින්) වන දින, එක් පාර්ශ්වයක් අංක PB 4847 යන සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය යටතේ ශ්‍රී ලංකාවේ පවතින නීති යටතේ සංස්ථාපිත කර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන, අංක 696, ගාලු පාර, කොළඹ 03 යන ස්ථානයෙහි තම ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන සීමාසහිත කාගිල්ස් බැංකුව (Cargils Bank Limited) (මින් මතුවට 'බැංකුව' ලෙස හැඳින්වෙන හා සන්දර්භයෙන් ඉඩ සැලසෙන හෝ අවශ්‍ය වනවිට එම යෙදුමෙන්, සීමාසහිත කාගිල්ස් බැංකුව සහ එහි අනුප්‍රාප්තිකයන් සහ අවසරලත් පත්කරනු ලැබූවන්ද ඇතුලත් වේ) සහ

අනෙක් පාර්ශ්වය ලෙස --------------------- (සමාගම් අංකය ඇතුලත් කරන්න) යන සමාගම් ලියාපදිංචි අංකය යටතේ ඉහත සඳහන් ශ්‍රී ලංකා ජනරජයෙහි නීති පරිදි නිසි අයුරුන් සංස්ථාගත කරන ලද ------------------------------------------------------------------- (ලිපිනය) යන ස්ථානයයෙහි තම ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ------------------------------ (සමාගමෙහි නම ඇතුලත් කරන්න) (මින් මතුවට වෙළෙඳසැල් හිමියා ලෙස හැඳින්වෙන හා සන්දර්භයෙන් ඉඩ සැලසෙන හෝ අවශ්‍ය වනවිට එම යෙදුමෙන්, ------------------------------------------------- (සමාගමෙහි නම ඇතුලත් කරන්න) සහ එහි අනුප්‍රාප්තිකයන් සහ අවසරලත් පත්කරනු ලැබූවන්ද ඇතුලත්ව) විසින් හා ඔවුන් අතර ඇති කර ගන්න ලදී,

------------------- දිනය සහිතව ---------------------------------------------- විසින් නිකුත් කරන ලද -------------------------------------- අංකය යටතේ ශ්‍රී ලංකා ජනරජයෙහි ලියාපදිංචි කරන ලද "----------------------------------------------------------" යන නාමධාරී විලාසය යටතේ පවතින හවුල් ව්‍යාපාරයක් ලෙස --------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------------

(හවුල්කරුවන්ගේ සම්පූර්ණ නම්, ජාතික හැඳුනුම්පත් අංක සහ ලිපින) විසින් එහි ප්‍රධාන ව්‍යාපාර ස්ථානය ලෙස ඉහත සඳහන් ශ්‍රී ලංකා ජනරජයෙහි ---------------------------------------------------- යන ස්ථානයෙහි (මින් මතුවට "වාණිජකරු" ලෙස හඳුන්වන අතර, මෙහි භාවිත කර ඇති පදය හෝ ප්‍රකාශනය සන්දර්භය විසින් අවශ්‍ය කරන හෝ පිළිගන්නා අවස්ථාවන්හිදී ඉහත සඳහන් ------------------------ (සියලුම හවුල්කරුවන්ගේ නම් ඇතුලත් කරන්න) විසින් එකාබද්ධව හෝ වෙන් වෙන්ව ඔවුන්ගේ උරුමක්කාරයන්, පොල්මංකරුවන්, සහ අද්මිනිස්ත්‍රාසිකරුවන් අදහස් වේ.) පවත්වාගෙන යනු ලබයි.

-------------------------------------- දිනය සහිතව ------------------------------ ලියාපදිංචි අංකය යටතේ ---------------------------------------------------------------------------------------------------- (ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයෙහි ලිපිනය ඇතුලත් කරන්න) යන ස්ථානයෙහි (මින් මතුවට "වාණිජකරු" ලෙස හඳුන්වන අතරෟ මෙහි භාවිත කර ඇති පදය හෝ ප්‍රකාශනය සන්දර්භය විසින් අවශ්‍ය කරන හෝ පිළිගන්නා අවස්ථාවන්හිදී ඉහත සඳහන් ------------------- (හිමිකරුගේ නම ඇතුලත් කරන්නෲ විසින් එකාබද්ධව හෝ වෙන් වෙන්ව ඔහුගේ උරුමක්කාරයන්ෟ පොල්මංකරුවන්ෟ සහ අද්මිනිස්ත්‍රාසිකරුවන් අදහස් වේ) -----------------------------------------(ව්‍යාපාර ස්ථානයෙහි නම ඇතුලත් කරන්න) යන නම සහ ශෛලිය යටතේ ----------------------------------------- (හිමිකරුගේ නම ඇතුලත් කරන්න) විසින් පවත්වාගෙන යනු ලබයි ---------------------------------------------------------------- යන ජාතික හැඳුනුම්පත් අංකය දරනු ලබන ---------------------------------------------------------------------------------------------------- (ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ස්ථානයෙහි ලිපිනය ඇතුලත් කරන්න) යන ස්ථානයෙහි (මින් මතුවට "වාණිජකරු" ලෙස හඳුන්වන අතරෟ මෙහි භාවිත කර ඇති පදය හෝ ප්‍රකාශනය සන්දර්භය විසින් අවශ්‍ය කරන හෝ පිළිගන්නා අවස්ථාවන්හිදී ඉහත සඳහන් -------------------- (තනි පුද්ගලයාගේ නම ඇතුලත් කරන්න) විසින් ඔහුගේ උරුමක්කාරයන්ෟ පොල්මංකරුවන්ෟ සහ අද්මිනිස්ත්‍රාසිකරුවන් අදහස් වේ.)
-------------------------------------------(තනි පුද්ගලයාගේ නම ඇතුලත් කරන්න.) විසින් පවත්වාගෙන යනු ලබයි.

බැංකුව යනු වාණිජකරුවන් අත්පත්කර ගැනීමටත්, විවිධ ජාල ඔස්සේ කාඩ්පත් නිකුත් කිරීමටත් හැකියාව ඇති, සමාගමක/ සම්බන්ධ හවුල්කරුවන්ගෙන් සහ/හෝ මූල්‍ය හෝ සමාන වෙනත් ආයතනවලින් බලපත්‍ර ලාභීෟ කාඩ්පතෙහි හිමිකාරීත්වය දරන්නා සහ/ හෝ කාඩ්පත නිකුත් කරන්නා සහ/ හෝ බලපත්‍රලාභියා වන බැවින් සහ;

වාණිජ්‍යකරුවා ඉහත සඳහන් කාඩ්පත්, කාර්යාලයන්හිදී/ බැංකු ශාඛාවන්හිදී/ වාණිජකරුට අයත් ආයතනයන්හිදී පිළිගැනීමට කැමති වන බැවින් සහ;

මින් මතුවට සඳහන් කරනු ලබන කොන්දේසි හා නියමයන්ට යටත්ව හා ඒ අනුව වට්ටම් සහ බැංකුව වෙත රඳවා ගැනීමට අයිතිය පවතින මුදල් අඩුකර ඉහත සඳහන් කළ කාඩ්පත් භාවිතය මගින් වාණිජකරුවා විසින් සිදු කරන ලද සියලුම විකුණුම්වල වටිනාකම වාණිජකරුවා වෙත ගෙවීමට බැංකුව එකඟ වී ඇති බැවින්;

එම කරුණු හේතුවෙන් මෙම ගිවිසුම පහත සඳහන් පරිදි සාක්ෂි දරනු ඇත.

**1. අර්ථනිරූපණය**

සන්දර්භය විසින් වෙනත් අයුරකින් අර්ථ නිරූපණය නොකරන අවස්ථාවන්හිදී මෙම ගිවිසුමෙහි පහත සඳහන් යෙදුම් සඳහා පහත සඳහන් අර්ථයන් නිරූපනය වේ.

a. **"බලය පැවරීම"** යන්නෙන් කාඩ්පතෙන් ගෙවීමක් සිදු කිරීම සඳහා බැංකුව විසින් වාණිජකරු වෙත ලබාදෙනු ලබන අනුමැතිය අදහස් වේ.

b. **"බලය පැවරීමේ සංකේතය/ කේතය (code)"** යන්නෙන් වාණිජකරු වෙත බැංකුව විසින් ලබාදෙනු ලැබූ හෝ කාඩ්පත් නිකුත්කරන්නා විසින් ලබා දෙනු ලැබූ කාඩ්පත සම්බන්ධව බලය පවරනු ලබන අවස්ථාවේදී බැංකුව හරහා සන්නිවේදනය කරනු ලබන සංකේතය/ කේතය (code) අදහස් වේ.

c. **"කාඩ්පත"** යන්නෙන් විවිධ වූ ජාල හරහා බැංකුව සහ/ හෝ වෙනත් සම්බන්ධිත හවුල්කරුවන්, ලියාපදිංචි මුල්‍ය සමාගම් හෝ ඒ හා සමාන වෙනත් ආයතනයන් විසින් භෞතික වශයෙන් සහ/ හෝ ඒ හා සමාන ආකාරයකින් නිකුත් කරනු ලැබූ කාඩ්පතක් අදහස් වේ.

d. **"කාඩ්පත්හිමියා"** යන්නෙන් කාඩ්පතක් නිකුත් කරන ලද්දේ කුමන පුද්ගලයෙකු වෙනුවෙන්ද, එම පුද්ගලයා හෝ එම කාඩ්පත භාවිත කිරීමට බලය හිමිව ඇති පුද්ගලයා අදහස් වේ.

e. **"ගාස්තු"** යන්නෙන් කාඩ්පත භාවිතයෙන් මිලදී ගනු ලැබූ භාණ්ඩ හා සේවාවන්ට අදාළ බදු මුදල්ද ඇතුලත්ව කාඩ්පත්හිමියා විසින් වාණිජකරු වෙත ගෙවිය යුතු වන කාඩ්පත සඳහා අය කරනු ලබන සියලුම ගාස්තුවල වටිනාකම අදහස් වේ.

f. **"අයකිරීම් වාර්තා පෝරමය / ආකෘතිය (form)"** යන්නෙන් වාණිජකරු විසින් අතින් ලියා හෝ ගාස්තුව පිළිබඳ විස්තර සහ / හෝ බැංකුව විසින් ඉල්ලුම් කරනු ලබන වෙනත් තොරතුරු සහිත EDCT වාර්තා තොරතුරු හරහා නිකුත් කරනු ලැබූ පෝරමය හෝ රිසිට්පත අදහස් වේ.

g. **"කාඩ්පත් නිකුත් කරන්නා"** යන්නෙන් බැංකුව සහ/ හෝ විවිධ ජාල හරහා කාඩ්පත් නිකුත් කරනු ලබන ඕනෑම සම්බන්ධිත හවුල්කරුවන්, ලියාපදිංචි මුල්‍ය හෝ ඒ හා සමාන ආයතන අදහස් වේ.

h. **"කාඩ්පත අත්පත් කර ගන්නා"** යන්නෙන් වාණිජකරුගෙන් ගනුදෙනු සහ දත්ත ලබාගෙන පවත්වා ගැනීම හා අත්පත්කර ගැනීම ඇතුලත්ව වෙළෙඳ කටයුතු අත්පත්කර ගැනීමේ ව්‍යාපාරයෙහි දී සිටින බැංකුව අදහස් වේ

i. **"වට්ටම්"** හෝ **"වාණිජ වට්ටම් අනුපාතය"** යන්නෙන් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන පරිදි වාණිජකරු විසින් බැංකුව වෙත ගෙවීමට බැඳී සිටින ගාස්තුවෙන් ප්‍රතිශතයක් හෝ කොටසක් අදහස් වේ.

j. **"ඉලෙක්ට්‍රොනික දත්ත පරිග්‍රහණය කිරීමේ කාඩ්පත් යන්ත්‍රය"** හෝ "EDCT" හෝ "POS උපාංගය" හෝ "POS" හෝ "MPOS" හෝ "ජංගම POS" (කාඩ්පත් යන්ත්‍රය) යන්නෙන් (ජංගම දුරකථන සහ පුද්ගලික ඩිජිටල් සහායකයන්ද ඇතුලත්ව) ඕනෑම කාඩ්පත් යන්ත්‍රයක්/ උපාංගයක්, කාඩ්පත් කියවන්නා, මුදල් යන්ත්‍ර හෝ (පාරිභෝගික සක්‍රීය කාඩ්පත් යන්ත්‍ර සහ ස්වයං සේවා කාඩ්පත් යන්ත්‍ර ඇතුලත්ව) පර්යන්ත (කාඩ්පත් යන්ත්‍ර) සහ වෙනත් උපාංගයකින් දත්ත ඉලෙක්ට්‍රොනිකව ග්‍රහණය කර ගැනීමේ හැකියාව සහ බලය පැවරීමේ ප්‍රතිචාරයන් සඳහා විද්‍යුත් සාක්ෂි ලබා ගැනීමේ හැකියාව ඇති, එමෙන්ම කාඩ්පත හරහා සිදු කරන ගනුදෙනු විද්‍යුත් වශයෙන් සැකසීමට වාණිජකරුහට හැකියාව ලබාදෙන, වාණිජකරු වෙත බැංකුව හෝ බැංකුව හැර වෙනත් පුද්ගලයෙකු විසින් සපයා ඇති පරිදි විකුණුම් දත්ත පිළිබඳ විද්‍යුත් සාක්ෂි සම්ප්‍රේෂණය කිරීමේ හැකියාව ඇති අවශ්‍ය ඕනෑම මෘදුකාංගයක් අදහස් වේ.

k. **"උපකරණය"** යන්නට EDCT, කාවද්දුම් මුද්‍රාව තබන උපකරණ (imprinters) ඇතුළු සියලු අදාළ උපාංග හා මෘදුකාංග සහ කලින් කලට ඒවා සඳහා සිදු කරනු ලබන ඕනෑම ආදේශනයක්, නවීකරණයක්, වැඩි දියුණු කිරීමක් සහ/ හෝ එකතු කිරීමක් ඇතුලත් වේ.

l. **"ආයතන"** යන්නට වෙළෙඳසැල, ගබඩාව, විකුණුම් ශාඛාව, කාර්යාල හෝ වාණිජකරුගේ වෙනත් ඕනෑම ආයතනයක් ඇතුලත් වේ.

m. **"වාණිජකරු සඳහා වන සීමාව"** යන්නෙන් කලින් කලට බැංකුව විසින් වාණිජකරු වෙත දැනුම්දී ඇති පරිදි එක් ගනුදෙනුවක් සඳහා කාඩ්පතක් මත සිදුකළ හැකි උපරිම ගාස්තුව අදහස් වේ.

n. **"ණය සීමාව ඉක්මවීමට ලබාදෙන බලය"** යන්නෙන් බැංකුවෙහි උපදෙස් පරිදි කාඩ්පතක් සඳහා අය කරනු ලබන ගාස්තුව ලබාදී ඇති ණය සීමාව ඉක්මවා යනවිට ඒ සඳහා අවශ්‍ය වන අවසරය අදහස් වේ.

o. **"මුදල් ආපසු ගෙවීමේ ආකෘතිය"** යන්නට 12.3 (a) (i) වගන්තිය හා බැඳී ඇති අර්ථය හිමි වේ.

p. **"පද්ධතිය"** යන්නෙන් කාඩ්පතක් හරහා සිදුකරනු ලබන ගනුදෙනු සඳහා අවසර ලබාදීමට බැංකුව සතු සැකසුම් පද්ධතිය අදහස් වේ.

q. **"අත්සන් තිරය"** යන්නෙන් කාඩ්පත්හිමියා විසින් සිය අත්සන යෙදිය යුතු ස්ථානය අදහස් වේ.

r. **"අවලංගු කිරීමේ ආකෘතිය"** යන්නට 12.3 (c) (i) වගන්තිය හා බැඳී ඇති අර්ථය හිමි වේ.

s. **"වාණිජකරු"** හෝ **"සේවා සම්පාදන ආයතනය"** යන්නෙන්, සහභාගිවන්නන් හෝ තෙවැනි පාර්ශ්වයක් සමග බැංකුව විසින් කාඩ්පත්හිමියන් සහ/ හෝ පාරිභෝගිකයන් හට එම ස්ථානයෙන් භාණ්ඩ සහ/ හෝ සේවාවන් ලබාගැනීමට සහ එවැනි මිලදී ගැනීම් සඳහා කාඩ්පත් භාවිතයෙන් සහභාගිවන්නන් හෝ ඒජන්සි හෝ තුන්වැනි පාර්ශ්වයක් විසින් ගෙවීම් සිදු කිරීමට බැංකුව විසින් බලය පවරන ලද ගිවිසුමකට එක්ව ඇති ඕනෑම නීතිමය ව්‍යාපාරික ආයතනයක් අදහස් වේ.

t. **"යෙදුම්"** යන්නෙන් ජංගම දුරකථන POS ඒකකයට ස්ථාපනය කර ඇති යෙදුම් මෘදුකාංගයෙහි නම අදහස් වේ.

සන්දර්භය (අර්ථ නිරූපන කටයුතු සඳහා) විසින් අවසර ලබා දේ නම් හෝ අවශ්‍ය වේ නම්, පුරුෂකාරක පදයන්ගෙන් ස්ත්‍රීකාරක පදයන්ද අදහස් වන අතර, සියලුම ඒකවචන යෙදුම් නිර්දේශයන්ට බහුවචන යෙදුම් සහ අලිංගික පදයන්ද ඊට ප්‍රතිලෝමවද අර්ථ දැක්වේ "වගන්තිය" ලෙස සඳහන් කරනු ලබන ඕනෑම අවස්ථාවකදී මෙහි සඳහන් වගන්තියක් අදහස් වේ.

**2. කාඩ්පත්**

කාඩ්පතක් මත හෝ ඒ හරහා කරනු ලැබූ ගාස්තුවක් සම්බන්ධ වන ආකාරයේ එක් එක් සහ සෑම ගනුදෙනුවක්ම සඳහා මෙම ගිවිසුම අදාළ වනු ඇත.

**3. කාඩ්පත් පිළිගැනීම**

මෙම ගිවිසුමෙහි දක්වා ඇති කොන්දේසි හා නියමයන්ට යටත්ව, වාණිජකරුහට කාඩ්පතක් හරහා එම ආයතනවලදී සිදුකරනු ලබන සියලුම ගනුදෙනු භාරගෙන පිළිගැනීමට හැකියාව ඇති වෙනත් කිසිඳු තරඟකාරී කාඩ්පත් වෙළෙඳ නාමයක් සමග පක්ෂපාතී වන අයුරින් මෙම කාඩ්පත් භාවිත කිරීම පිළිබඳව වෙනස් අයුරින් සැලකීමක් හෝ අධෛර්යමත් කිරීමක් සිදුවන ආකාරයේ පුරුදු හෝ පටිපාටිවල නිරත වීම වාණිජකරු විසින් නොකළ යුතුයි

**4. විද්‍යුත් දත්ත ග්‍රහණය කිරීමේ කාඩ්පත් යන්ත්‍ර ස්ථාපනය කිරීම සහ බලය පැවරීමේ පද්ධතිය භාවිත කිරීම**

බැංකුව විසින් විද්‍යුත් දත්ත ග්‍රහණය කිරීමේ කාඩ්පත් යන්ත්‍ර (EDCT) ස්ථාපනය කිරීම සහ වාණිජකරු වෙත එවැනි වෙනත් උපකරණ සහ පද්ධති වෙත අවශ්‍ය පිවිසුම් ලබාදීම, බැංකුව විසින් ඊට සුදුසු යැයි සිතන ආකාරයෙන් සිදුකරනු ඇති අතර, තම ආයතනය තුළ එම උපකරණ ස්ථාපනය කිරීමට වාණිජකරු විසින් බැංකුව වෙත අවසර ලබාදිය යුතුයි වෙනත් බැංකුවක් විසින් ලබාදුන් EDCT යන්ත්‍රයක් භාවිත කිරීමට වාණිජකරුට බැංකුව විසින් අවසර ලබාදුන් අවස්ථාවකදී, එම වෙනත් බැංකු හා ආයතන සමග ඇති කරගත් හවුල් ගිවිසුමට අනුව එම අදාළ EDCT යන්ත්‍රය (යන්ත්‍ර) හරහා පද්ධතිය වෙත ඇතුළු වීමට වාණිජකරු වෙත හැකියාව ලබාදෙනු ඇත.

**5. EDCT යන්ත්‍රය (යන්ත්‍ර) ක්‍රියා කරවීම සහ පද්ධතිය භාවිත කිරීම.**

බැංකුව විසින් EDCT යන්ත්‍රය (යන්ත්‍ර) තම ආයතනය වෙත ගෙනවිත් භාරදී ස්ථාපනය කරනු ලැබූ සෑම අවස්ථාවකදීම, වාණිජකරු විසින්

a. කලින් කලට බැංකුව විසින් වාණිජකරු වෙත ලබාදෙනු ලබන උපදෙස්වලට අනුව හා ඒවාට අනුකූලව එම උපකරණ ක්‍රියා කරවිය යුතුය.

b. උපකරණය භාවිතය හා සම්බන්ධව එම උපකරණ මගින් පරිභෝජනය කරනු ලබන ඕනෑම විදුලියක පිරිවැය සඳහා සහ ඕනෑම දුරකථන සහ / හෝ දත්ත සඳහා වන ගාස්තු වෙනුවෙන් ගෙවිය යුතු පිරිවැය සඳහා වගකිව යුතුය.

c. උපකරණයේ මෘදුකාංග හෝ දෘඩාංග වෙනස් කිරීම හෝ වෙනත් ආකාරයකින් සැකසීමට යාම සිදු නොකළ යුතුය.

d. සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සිදුවන සෑම වේලාවන්වලදීම එම උපකරණ භාවිතය පිළිබඳ පුහුණුවක් ලද අවම වශයෙන් වාණිජකරුගේ සේවකයන් දෙදෙනෙකු හෝ (විකුණුම් සිදුකරන සේවකයෙකු හා අධීක්ෂකයෙකු) එම ව්‍යාපාර ස්ථානයෙහි සිටිය යුතු බවට වගබලා ගත යුතුය.

e. උපකරණය ක්‍රියාත්මක කිරීමෙහි දෝෂයක් හෝ දෝෂයක් ඇති විය හැකි බවට සැක කරන යමක් ඇත්නම්, ඒ බව බැංකුව වෙත වහාම වාර්තා කළ යුතුය.

f. බැංකුවෙහි ලිඛිත අවසරය ඇතිව හැර උපකරණය ඉවත් කිරීම හෝ එහි වෙනස්කම් කිරීම හෝ යම් ආදේශනයන් එකතු කිරීම හෝ ඒ මත ඕනෑම සලකුණක් ඇති කිරීම සඳහා අවසර හිමි නොවේ.

g. උපකරණය සහ / හෝ පද්ධතිය හා සම්බන්ධව බැංකුව වෙතින් ලබාදෙනු ලැබූ සියලුම තොරතුරු තරයේම රහස්‍යභාවයකින් යුතුව තබා ගත යුතු අතර, එම උපකරණය මෙහෙයවීමේ සහ පද්ධතිය භාවිත කිරීමේ අවශ්‍යතාව සහිත සේවකයන්ට පමණක් එම තොරතුරු අනාවරණය කළ යුතුය. රහස්‍යභාවය රැකීම සඳහා වන බැඳී සිටීම පිළිබඳ තම සේවකයන් දැනුවත්ව සිටින බව සහතික කිරීම සඳහා වාණිජකරු විසින් අවශ්‍ය සියලු පියවර ගත යුතු අතර, විශේෂයෙන්, එහෙත් සීමාවකින් තොරව උපකරණය හා පද්ධතිය භාවිත කිරීම කෙරෙහි බලපාන දත්ත කේතන සහ කාඩ්පත් යන්ත්‍ර ස්ථාපනය කිරීමේ ක්‍රියාපටිපාටි සම්බන්ධයෙන් දැඩි ආරක්ෂක පියවර පවත්වා ගෙන යා යුතුය.

h. බැංකුවෙහි පූර්ව ලිඛිත අවසරයකින් තොරව කුමන ආකාරයේ හෝ කිසිඳු අවශ්‍යතාවක් මත තුන්වැනි පාර්ශ්වයක් විසින් උපකරණය භාවිත කිරීමට හෝ පද්ධතිය වෙත ඇතුළු වීමට අවසර ලබා නොදිය යුතුය.

i. උපකරණය වාණිජකරුගේ භාරයෙහි පවතිනතාක් කල් සෑමවිටම උපකරණය සුරක්ෂිතව තබා ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතුය.

j. වාණිජකරු හෝ වාණිජකරු යටතේ සේවය කරනු ලබන ඕනෑම සේවකයෙකු හිතා මතා හෝ අහම්බෙන් උපකරණය අස්ථාන ගත කළහොත් උපකරණයෙහි පිරිවැය බැංකුව වෙත ගෙවීමට බැඳී සිටිය යුතු අතර, එම වෙළෙඳ ආයතනයෙහි නව උපකරණයක් ආදේශනය කිරීම බැංකුවෙහි පූර්ණ අභිමතය යටතේ සිදුවනු ඇත.

k. නොසැලකිලිමත්භාවය හේතුවෙන් උපකරණයට හානි සිදු වුවහොත්, උපකරණයෙහි දේශීය නියෝජිතයන් විසින් ඇස්තමේන්තුගත කර ඇති අලුත්වැඩියා කිරීමේ පිරිවැය පියවිය යුතුය.

**6. කාඩ්පත් පිළිගැනීම**

6.1 වෙළෙඳ ආයතනය (ආයතන) තුළදී පාරිභෝගිකයා හට කාඩ්පත භාවිතයෙන් භාණ්ඩ හා සේවාවන් මිලදී ගැනීමට වාණිජකරු විසින් අවසර ලබාදෙනු ලබන්නේ පහත කරුණු සපුරාලයි නම් පමණි.

a. කාඩ්පත ආරම්භක දිනයට පසුව සහ කල් ඉකුත් වීමේ දිනයට පෙර (එම දිනයන් කාඩ්පතෙහි මුහුණතෙහි සඳහන් කර ඇත්නම්) ඉදිරිපත් කිරීම.

b. කාඩ්පත අවලංගු කිරීම හෝ අත්හිටුවීම පිළිබඳව වාණිජකරු වෙත බැංකුව විසින් දැනුම්දී නොමැති නම් හෝ එම කාඩ්පතෙහි ගනුදෙනුවක් ප්‍රතික්ෂේප කරන ලෙස බැංකුව වෙනත් ආකාරයකින් වාණිජකරු වෙත දැනුම් දී නොමැති විය යුතුය.

c. කාඩ්පතෙහි මුහුණත මත නම සඳහන් කර ඇති පුද්ගලයාගේ අත්සන කාඩ්පතෙහි යොදා තිබීම.

d. අය කිරීම් වාර්තා පෝරමය ආකෘතියහෝ හෝ අත්සන් පටිගත කිරීමේ තිරය මත ව්‍යාපාරිකයාගේ සේවකයෙකු ඉදිරියේ කාඩ්පත්හිමියා විසින් කාඩ්පතෙහි සඳහන් කර ඇති අත්සනම යොදමින් අත්සන් කර තිබීම.

e. අදාළ අවස්ථාවන්වලදී වාණිජකරු විසින් අයිරාවක් සඳහා අවසර ලබාගෙන තිබීම.

f. කාඩ්පත දෘශ්‍යමය ලෙස වෙනස් කර හෝ විකෘති කර නොමැති වීම.

g. කාඩ්පත ශ්‍රී ලංකාව තුළ භාවිත කිරීමට වලංගු වීම; සහ

h. ගනුදෙනුව මෙම ගිවිසුමෙහි සියලුම විධිවිධානවලට, බැංකුව විසින් කලින් කලට නියම කර බැංකුව විසින් වාණිජකරු වෙත දන්වා එවා ඇති අනෙකුත් සියලුම කොන්දේසි හා නියමයන්, රීති හෝ ක්‍රියාපටිපාටිවලට අනුකූල වීම වේ.

6.2 කාඩ්පත්හිමියකුගේ අත්සනක වලංගුභාවය පිළිබඳ සැකයක් පවතින අවස්ථාවකදී එම අත්සන ඔහුගේ / ඇයගේ අත්සන වන බවට නිශ්චිත වශයෙන්ම අව්‍යාජභාවය සඳහන් දිවුරුම් ප්‍රකාශයක් ලබාදිය යුතුය.

**7. බලය පැවරීම**

7.1 EDCT හරහා හැර වෙනත් ආකාරයකින් ගනුදෙනුවක් සිදු වුවහොත්, වාණිජකරු විසින් බැංකුවෙහි බලය පැවරීමේ මධ්‍යස්ථානයෙන් බලය ලබාගත යුතු අතර, එවැනි ගනුදෙනුවක් අවසන් කිරීමට පෙර බලය පැවරීමේ කේතය, අයකිරීම් වාර්තා පෝරමයෙහි පැහැදිලිව සටහන් කළ යුතුය.

a. ගාස්තු පියවීම සඳහා ණය සීමාව ඉක්මවීමට අවසර අවශ්‍ය අවස්ථා

b. කාඩ්පත්හිමියා විසින් කාඩ්පත ඉදිරිපත් නොකරන අවස්ථා

c. කාඩ්පත ව්‍යාජ එකක් හෝ සොරකම් කර හෝ අස්ථානගත වී ඇතැයි වාණිජකරු විසින් විශ්වාස කරන අවස්ථා

d. කාඩ්පත ඉදිරිපත් කිරීම හෝ සිදු කිරීමට නියමිත ගනුදෙනුව පිළිබඳ සැක කටයුතු බවක් සහිත අවස්ථා

යන අවස්ථාවන්හිදී ඒ පිළිබඳ වාණිජකරු විසින් ඒ බව බැංකුව වෙත දැනුම්දී අදාළ ගනුදෙනුව සිදු කිරීම සඳහා අවසර ලබාගත යුතුය.

7.2 වාණිජකරු වෙත බැංකුව හෝ වෙනත් බැංකුවකින් EDCT යන්ත්‍රයක් සපයා ඇත්නම් හෝ වෙනත් ආකාරයකින් පද්ධතිය වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලබාදී ඇත්නම්, කාඩ්පතක් මගින් සිදුකරනු ලබන සෑම ගනුදෙනුවක් සඳහාම ඈක්ෂ හරහා අවසරය ලබාගත යුතුය.

7.3 EDCT යන්ත්‍රයෙහි බිඳවැටීමක් හෝ ඕනෑම හේතුවක් නිසාවෙන් EDCT යන්ත්‍රය අක්‍රීයව පවතී නම්, එම ඈක්ෂ යන්ත්‍රය නැවත යථාතත්ත්වයට පත්වන තුරු බැංකුව මගින් උපදෙස් ලබා දුන් අවස්ථාවකදී හැර සෑමවිටම කාඩ්පතක් මගින් සිදුකරනු ලබන සෑම ගනුදෙනුවක් සඳහාම වාණිජකරු විසින් බැංකුවෙහි බලය පැවරීමේ මධ්‍යස්ථානය වෙතින් අවසරය ලබා ගත යුතුය.

**8. ගනුදෙනුවක් සිදුකරන අවස්ථාවකදී කාඩ්පත් රඳවා ගැනීම**

වාණිජකරු විසින්,

a. බැංකුව වෙත බලය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් සිදුකරන අවස්ථාවක් අතරතුර දී කාඩ්පත රඳවා ගැනීම;

b. කාඩ්පත රඳවා තබා ගැනීමට සහ කාඩ්පත කාඩ්පත්හිමියා වෙත නැවත ලබා නොදීමට බැංකුව විසින් නියම කරනු ලබන අවස්ථාවකදී, හැකිතාක් සාධාරණ සහ සාමකාමී අයුරින් සිය උපරිම උත්සාහයෙන් එය ඉටු කිරීම;

c. බැංකුවෙහි බලය පැවරීමේ මධ්‍යස්ථානය මගින් හෝ ඈක්ෂ යන්ත්‍රය හරහා ලැබුණු උපදෙස් හෝ විධානයන්වලට අනුකූල වීම;

සිදුකළ යුතුය.

**9. EDCT යන්ත්‍රය (යන්ත්‍ර) හරහා සහ එසේ නොමැතිව වෙනත් ආකාරයකින් සම්පූර්ණ කරන ලද ගනුදෙනුව**

9.1 EDCT යන්ත්‍රයකින් සිදු කරන අවස්ථාවකදී හැර කාඩ්පත හරහා ගනුදෙනුවක් සිදු කරනු ලබන සෑම අවස්ථාවකදීම වාණිජකරු විසින් අයකිරීම් වාර්තා පෝරමයෙහි / ආකෘතියෙහි අදාළ ගාස්තු පිළිබඳ විස්තර සටහන් කරමින් පැහැදිලිව කියවිය හැකි පරිදි සම්පූර්ණ කළ යුතුය.

එකී අයකිරීම් වාර්තා පෝරමයෙහි / ආකෘතියෙහි පහත කරුණු ඇතුලත් විය යුතුය.

a. බැංකුවට පිළිගත හැකි කාවැද්දුම් මුද්‍රණ යන්ත්‍රයක් භාවිතයෙන් සිදු කරන ලද කාඩ්පතෙහි කාවැද්දුම් මුද්‍රණය;

b. කාඩ්පත මත ගාස්තුව අය කරන ලද දිනය (වාණිජකරු විසින් ගාස්තුව අය කරන ලද දිනය සඳහන් නොවන කාවැද්දුම් මුද්‍රණ යන්ත්‍රයක් භාවිත කළේ නම්, එම දිනය වාණිජකරු විසින් අයකිරීම් වාර්තා පෝරමයෙහි පැහැදිලිව ලියා සඳහන් කළ යුතුය.);

c. සියලුම භාණ්ඩ හා සේවාවන් පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක්;

d. ගාස්තුවෙහි වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින් (හෝ වෙනත් ව්‍යවහාරික මුදල් වර්ගයකින් කාඩ්පත හරහා ගනුදෙනු සිදු කිරීමට වාණිජකරු වෙත බලය ලබා දී ඇත්නම් පමණක්, එම මුදල් වර්ගයෙන්);

e. අවශ්‍ය අවස්ථාවන්හිදී ණය සීමාව ඉක්මවීම සඳහා වන බලය පැවරීම අනුමත කිරීමේ කේතය හෝ වෙනත් අනුමත කිරීම් කේත අංකයන්;

f. කාඩ්පත්හිමියාගේ අත්සන, වාණිජකරු විසින් නිකුත් කරනලද විකුණුම් ඉන්වොයිස්වල සෑම පිටපතකම සඳහන් වන බවට තහවුරු කර ගන්න. (බැංකුව විසින් කාඩ්පත්හිමියාගේ අත්සන එවැනි විකුණුම් ඉන්වොයිස් මත ලබාගැනීම අවශ්‍ය ලෙස ඉල්ලුම් කර ඇති ගනුදෙනු සඳහා);

g. ආයතනයෙහි නම, එහි ලිපිනය සහ බැංකුව විසින් එම ආයතනය සඳහා ලබා දී ඇති වෙළෙඳ අංකය; සහ

h. බැංකුව විසින් කලින් කලට වාණිජකරු වෙත දැනුම් දී ඇති පරිදි අවශ්‍ය යැයි සඳහන් සියලුම වෙනත් විස්තර අයකිරීම් වාර්තා පෝරමයෙහි / ආකෘතියෙහි ඇතුලත් කළ යුතුය.

9.2 වාණිජකරු විසින් ඈක්ෂ යන්ත්‍රය (යන්ත්‍ර) මගින් ගනුදෙනුව (ගනුදෙනු) හැසිරවීමේදී

a. EDCT යන්ත්‍රය, බැංකුව විසින් පිළිගත හැකි එකක් බවට (EDCT යන්ත්‍රය බැංකුව හැර වෙනත් පුද්ගලයෙකු විසින් සපයන ලද අවස්ථාවන් හිදී) සහතික වන්න;

b. කාඩ්පත්වලින් දත්ත උපුටා ගැනීම බැංකුව විසින් නියම කරන ලද පරිදි සිදු වන බවට සහතික වන්න. (මෙය කලින් කලට වෙනස් විය හැකි නමුත්, එසේ වන්නේ නම් වාණිජකරු වෙත බැංකුව විසින් පෙර දැනුම්දීමක් සිදුකරනු ඇත.);

c. ගාස්තුව සහ කලින් කලට බැංකුව විසින් අයකිරීම් වාර්තා පෝරමයෙහි / ආකෘතියෙහි මුද්‍රණය විය යුතු බවට දැනුම්දෙනු ලබන ඕනෑම ආකාරයේ වැඩිදුර තොරතුරු (කාඩ්පත්හිමියාගේ අංකය හා දත්ත) බැංකුව විසින් අනුමත කරන ලද ආකෘතියකට අනුව ඇති බවට සහතික වන්න;

d. මෙම ගිවිසුමෙහි අවශ්‍යතා සඳහා වන දත්ත ඉලෙක්ට්‍රොනික නිස්සරණය, රඳවා තබා ගැනීම සහ සම්ප්‍රේෂණ සඳහා වන උපකරණ සහ ක්‍රියා පටිපාටි, බැංකුවෙහි අවශ්‍යතාවන්ට අනුව පවතින බවට සහ බැංකුව විසින් අනුමත කර ඇති බවට සහතික වන්න;

e. කාඩ්පත්හිමියාගේ අත්සන වාණිජකරු විසින් නිකුත් කරන ලද විකුණුම් ඉන්වොයිස් පතෙහි සෑම පිටපතකම සඳහන් කර ඇති බවට (බැංකුව විසින් කාඩ්පත්හිමියාගේ අත්සන එවැනි විකුණුම් ඉන්වොයිස් මත ලබාගැනීම අවශ්‍ය ලෙස ඉල්ලුම් කර ඇති ගනුදෙනු සඳහා) සහතික වන්න; සහ

f. ගනුදෙනුව සම්පූර්ණ කිරීමට පෙර කාවද්දුම් මුද්‍රණය (එම්බොස්) කර ඇති කාඩ්පත් අංකය සහ EDCT කාඩ්පත් යන්ත්‍රයෙහි පෙන්වන කාඩ්පත් අංකය අතර වෙනසක් නොමැති බවට සහතික වන්න.

9.3 කාඩ්පත්හිමියාගේ අත්සන අයකිරීම් වාර්තා පෝරමයෙහි / ආකෘතියෙහි සඳහන් වන බවටත් කාඩ්පත්හිමියා වෙත සත්‍ය හා සම්පූර්ණ කරන ලද අයකිරීම් වාර්තා පෝරමයෙහි / ආකෘතියෙහි පිටපතක් ලබාදෙන බවටත් වාණිජකරු සහතික විය යුතුය.

9.4 කාඩ්පතෙහි ඡායාරූපයක් සඳහන්ව ඇත්නම්, වාණිජකරු විසින් ගනුදෙනුව ක්‍රියාත්මක කිරීමට පෙර කාඩ්පත ඉදිරිපත් කරන පුද්ගලයා එම කාඩ්පතෙහි සඳහන් ඡායාරූපයෙහි දැක්වෙන පුද්ගලයාමද යන බවට සහතික විය යුතුය.

9.5 බැංකුව විසින් කලින් කලට වාණිජකරු වෙත දැනුම් දෙන පරිදි අයකිරීම වාර්තා පෝරම / ආකෘති සම්පූර්ණ කිරීම හෝ නිකුත් කිරීම සඳහා හෝ කාඩ්පත භාවිතයෙන් සිදුකරන ගනුදෙනු හැසිරවීම සඳහා අදාළ ක්‍රියාපටිපාටීන් සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම සිදුකළ යුතු අතර, වාණිජකරු විසින් එකී සංශෝධිත හෝ වෙනස් කරන ලද ක්‍රියාපටිපාටීන්ට අනුකූල විය යුතුය.

9.6 වාණිජකරු විසින් ඍක්ෂ / ෂඩ් හෝ බැංකුව විසින් සපයනු ලබන හෝ බලය පවරන ලද වෙනත් කාඩ්පත් යන්ත්‍ර හැර ගෙවීම් සිදුකරන කාඩ්පත්වල දත්ත ග්‍රහණය කරගනු ලබන වෙනත් කිසිඳු ඉලෙක්ට්‍රොනික උපකරණයක කාඩ්පත භාවිත කිරීම (අසවැ) නොකළ යුතුය.

**10. ගනුදෙනු හැසිරවීමේදී වාණිජකරු සඳහා වන පොදු වගකීම්**

10.1 කාඩ්පත්හිමියෙකු සමග කාඩ්පතක් හා සම්බන්ධ වන ගනුදෙනුවක් මෙහෙයවීමේදී, වාණිජකරු;

එකී අයකිරීම් වාර්තා පෝරමයෙහි / ආකෘතියෙහි පහත කරුණු ඇතුලත් විය යුතුය.

a. කාඩ්පත් භාවිතය පිළිබඳ වාණිජකරු විසින් පිළිගනු ලබන වෙනත් කාඩ්පත් සඳහා පනවා නොමැති කිසිඳු අමතර කොන්දේසි හෝ සීමාවන් පැනවීමක් නොකළ යුතුය.

b. බැංකුව විසින් ඉල්ලීමක් කර ඇති අවස්ථාවකදී හැර වෙනත් කිසිඳු අවස්ථාවකදී කාඩ්පත්හිමියාගේ පුද්ගලික පදිංචි ස්ථානයේ දුරකථන අංකය, ලිපිනය, රියදුරු බලපත්‍රය හෝ ගුවන් ගමන් බලපත්‍රයෙහි විස්තර වැනි පුද්ගලික තොරතුරු කිසිවක් ලබාදෙන ලෙස කාඩ්පත්හිමියාගෙන් ඉල්ලුම් නොකළ යුතුය.

c. බැංකුව විසින් ඉල්ලීමක් කරන ඇති අවස්ථාවකදී හැර වෙනත් කිසිඳු අවස්ථාවකදී කාඩ්පතෙහි ඡායාපිටපතක් ලබාදෙන ලෙස කාඩ්පත්හිමියාගෙන් ඉල්ලුම් නොකළ යුතුය.

d. කාඩ්පත හරහා සිදු කරනු ලබන මිලදී ගැනීම් සඳහා නීත්‍යනුකූලව අවශ්‍ය වන සියලුම බදු මුදල් ඇතුලත් කරන්න. මෙම අවශ්‍ය බදු ගාස්තු අය කිරීම් වාර්තා පෝරමයෙහි / ආකෘතියෙහි ඇතුලත් කළ යුතුය.

e. මුදල් හුවමාරුවකට අවසර ඇති තැන්පත් කිරීමේ සහතිකපත් (ජරසවඑ) හෝ තෑගි සහතිකපත් මිලදී ගැනීම් සඳහා කාඩ්පත පිළිනොගත යුතුය.

f. පිළිගත නොහැකි චෙක්පතක් හෝ පෙර ගෙවිය යුතු මුදලක් සඳහා ප්‍රතිමූල්‍යකරණය කිරීමට උත්සාහ කරනු ලබන කාඩ්පත්හිමියකු සඳහා ගනුදෙනුවක් නිර්මාණය නොකළ යුතුය.

g. වෙනත් වාණිජකරුවන් වෙනුවෙන් ගනුදෙනු ඉදිරිපත් නොකළ යුතුය.

h. වාණිජකරුහට මුදල් බෙදාහැරීමේ සැපයුම්කරුවෙකු ලෙස නිශ්චිතවම අවසරදී නොමැති නම්, කාඩ්පත ඉදිරිපත් කිරීමෙන් පසු මුදල් සැපයීම සිදු නොකළ යුතුය.

i. සෑමවිටම බැංකුව විසින් නියම කර ඇති පරිදි වර්තමානයේ පවතින ඡක්ෂ දත්ත ආරක්ෂණ ප්‍රමිතියට අනුකූල වන්න.

j. දත්ත සම්මුති පිළිබඳ සියලුම හදිසි අවස්ථාවන් බැංකුව වෙත වහාම දැනුම් දිය යුතු අතර, එවැනි සිදුවීමක් හඳුනාගැනීමෙන් පැය විසි හතර (24)ක් ගෙවී යාමට පෙර ඒ බව දැනුම් දිය යුතුය.

10.2 විදේශ මුදල් හා සම්බන්ධ කාඩ්පත ගනුදෙනු, වාණිජකරු විසින් ඒ හා අදාළ අධිකාරියෙන් / නියාමකයින්ගෙන් විදේශ මුදල් බලපත්‍රය ලබාගත යුතු අතර, එය වරින් වර අදාළ කාල සීමාවන්හිදී අලුත් කර නීතිමය වශයෙන් වලංගු තත්ත්වයේ පවතී යන කොන්දේසියට යටත් වේ.

**11. අය කිරීම් වාර්තා පෝරම / ආකෘති කිහිපයක් භාවිත කිරීම**

11.1 එක් ගනුදෙනුවක් සඳහා වාණිජකරු වෙත ලබාදී ඇති සීමාව ඉක්මවීම වැළැක්වීම සඳහා වාණිජකරු විසින් අය කිරීම් වාර්තා පෝරම දෙකක් හෝ කිහිපයක් භාවිත කිරීමෙන් වැළකිය යුතුය.

11.2 පහත අවස්ථාවලදී හැර, යම් ගනුදෙනුවක් සඳහා ගෙවිය යුතු මුදලින් කොටසක් පමණක් එක් අය කිරීම් වාර්තා පෝරමයකට / ආකෘතියකට ඇතුලත් කර ඇති අවස්ථාවන්හිදී වාණිජකරු විසින් කාඩ්පත හරහා ගනුදෙනුවක් සිදු නොකළ යුතුය.

a. අදාළ මුදලෙහි ශේෂය මුදල් හෝ චෙක් පතක් මගින් ගෙවනු ලබන අවස්ථාවකදී හෝ,

b. භාණ්ඩ හෝ සේවාවන් පසු දිනයකදී භාරදීමට හෝ සිදු කිරීමට නියමිතව තිබේනම් සහ එවැනි අවස්ථාවකදී අය කිරීම් වාර්තා පෝරම / ආකෘති දෙකක් භාවිත කිරීම සඳහා වාණිජකරු විසින් බැංකුව වෙතින් බලය ලබාගෙන එම අය කිරීම් වාර්තා පෝරමයන්හි / ආකෘතීන්හි බලය පැවරීමේ කේතය සුදුසු පරිදි, "තැන්පතු" සහ "ශේෂය" හෝ "ඉතිරිය" යන වචන සඳහන් කරමින් එක් අය කිරීම් වාර්තා පෝරමයකින් / ආකෘතියකින් ඒ සඳහා කරන ලද තැන්පතු මුදලක් නිරූපනය වන පරිදි සහ වෙනත් අය කිරීම් වාර්තා පෝරමයෙන් / ආකෘතියෙන් ගෙවිය යුතු ඉතිරි මුදල් ශේෂය නිරූපනය වන පරිදි යොදාගනු ලබන අවස්ථාවකදී, "ශේෂය" ලෙස සඳහන් කර ඇති අය කිරීම් වාර්තා පෝරමය / ආකෘතිය, අදාළ භාණ්ඩ භාරදෙන තෙක් හෝ සේවාවන් සපයා අවසන් වන තෙක් බැංකුව වෙත භාරදීම නොකළ යුතුය.

**12. ගනුදෙනු තොරතුරු ඉදිරිපත් කිරීම හා මුදල් ආපසු ගෙවීම්**

12.1 ඍක්ෂ භාවිතයෙන් හැර වෙනත් ආකාරයකින් සිදුකරනු ලැබූ ගනුදෙනු සම්බන්ධයෙන් වාණිජකරු විසින් "ගාස්තු සාරාංශය" ලෙස හැඳින්වෙන ස්ලිප් පතක් (කසච) සහ / හෝ බැංකුව විසින් ඉල්ලුම් කරනු ලබන එවැනි වෙනත් ලේඛනයක් ("ගනුදෙනු තොරතුරු") පහත කරුණු සඳහන් කරමින් සම්පූර්ණ කළ යුතුය.

a. ඉදිරිපත් කරනු ලැබූ අය කිරීම් වාර්තා පෝරම / ආකෘති මගින් අය කරනු ලැබූ මුළු මුදල (අදාළ ගාස්තු අය කිරීම් පෝරම / ආකෘතිද ඒ සමග අමුණන්න);

b. එම අය කිරීම් වාර්තා පෝරම / ආකෘතිවල වට්ටම සහ වෙළෙන්දා හට හිඟව පවතින ශුද්ධ මුදල් ප්‍රමාණය. වාණිජකරු විසින් ඉහත සඳහන් කළ ගනුදෙනු තොරතුරු, ගනුදෙනුව සිදුකර දින හතක් (7) ඇතුළත බැංකුව වෙත ඉදිරිපත් කළ යුතුය.

12.2 12.1 වගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබූ ගනුදෙනු තොරතුරු සඳහා බැංකුව විසින් ඉලෙක්ට්‍රොනික විද්‍යුත් මාධ්‍යයක් හරහා එකඟ වී ඇති අවස්ථාවකදී, වාණිජකරු විසින් සෑම දිනයකම ගනුදෙනු අවසන් කර, එදින ගනුදෙනු සඳහා ඍක්ෂ මත ගනුදෙනු පියවා අවසන් කර, එදින සිදුකරනු ලැබූ ගනුදෙනු සම්බන්ධයෙන් වාණිජකරු වෙත ගෙවිය යුතු මුදල දක්වා පැමිණිය යුතුය. ("පියවිය යුතු මුදල")

12.3 ඕනෑම ගනුදෙනුවක් සම්බන්ධයෙන්, කාඩ්පත්හිමියා වෙත ඕනෑම භාණ්ඩයක් නොලැබුණේ නම් හෝ නීත්‍යනුකූලව ප්‍රතික්ෂේප වුණේ නම් හෝ නැවත භාර ගනු ලැබුවේ නම් හෝ ගනුදෙනුව හා සම්බන්ධ සේවාවන් ලබා නොදුන්නේ නම්, ඒවා අවලංගු කළේ නම් හෝ කාඩ්පත්හිමියා විසින් මිල ගණන් නීත්‍යනුකූලව විවාදයට ලක් කරනු ලබයි නම් හෝ මිල ගණන් වෙනස් කිරීමට අවසර ලබා දී ඇත්නම්, වාණිජකරු විසින් මුදල් නැවත ලබාදීමක් සිදු නොකරනු ඇති අතර, මෙහි දක්වා ඇති ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් කාඩ්පත්හිමියා වෙත මුදල් ආපසු ලබාදීම සිදුකළ යුතුය.

a. 12.1 වගන්තියෙහි සඳහන් ගනුදෙනු තොරතුරුද සමගින් මුදල් ආපසු ලබා දීමක් අවශ්‍ය වන ගනුදෙනුවට අදාළ තොරතුරු ඒ වනවිටත් බැංකුව වෙත ඉදිරිපත් කර ඇති අවස්ථාවකදී වාණිජකරු විසින්,

(i). කාඩ්පත්හිමියාට බැර කළ යුතු මුදල, භාණ්ඩ හා සේවාවන් පිළිබඳ කෙටි විස්තරයක්, කාඩ්පත් අංකය, මුදල් නැවත ලබාදීමක් ඉල්ලුම් කරන ලද දිනය සඳහන් කරමින් අය කිරීම් වාර්තා පෝරමය / ආකෘතිය සම්පූර්ණ කර, එම අය කිරීම් වාර්තා පෝරමයෙහි "නැවත මුදල් ලබා දීම" ලෙස පැහැදිලිව සඳහන් කර එකී මුදල් ආපසු ලබාදීමේ පෝරමය අත්සන් කළ යුතුය.

(ii). මුදල් ආපසු ලබා දීමේ පෝරමහි / ආකෘතියෙහි සත්‍ය හා සම්පූර්ණ කරන ලද පිටපතක් කාඩ්පත්හිමියා වෙත ලබාදිය යුතුය.

(iii). මුදල් ආපසු ලබාදීමේ පෝරමය / ආකෘතිය ජනනය කර දින හතක් (7) ක් ඇතුලත, එකී මුදල් ආපසු ලබාදීමේ පෝරමහි / ආකෘතියෙහි පිටපතක්, එම ගනුදෙනුව සිදුකිරීම සඳහා පෙර ලබාගත් අවසරය (එවැන්නක් ඇත්නම් පමණක්) අවලංගු කරන ලෙස ඉල්ලා බැංකුව වෙත කරනු ලබන ලිඛිත ඉල්ලීමක් සමගින් බැංකුව වෙත ලබාදිය යුතුය.

b. 12.1 වගන්තියෙහි සඳහන් තොරතුරුද ඇතුලත්ව මුදල් නැවත ලබාදීමක් අවශ්‍ය කරන ගනුදෙනුව හා සම්බන්ධ තොරතුරු බැංකුව වෙත ලබාදී නොමැති නම්, වාණිජකරු විසින්

(i). අය කිරීම් වාර්තා පෝරමය / ආකෘතිය සහ එහි ඕනෑම පිටපතක් විනාශ කර එම විනාශ කරන ලද පිටපත් කාඩ්පත්හිමියා වෙත ලබාදිය යුතුය.

(ii). ගනුදෙනුව සිදුකිරීම සඳහා පෙර ලබාගත් අවසරය (එවැන්නක් ඇත්නම් පමණක්) අවලංගු කරන ලෙස බැංකුව වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

c. EDCT හරහා මුදල් ආපසු ලබාදීම සිදු වුවහොත්, 12.2 වගන්තියෙහි පරිදි වාණිජකරු විසින් යම් ගනුදෙනුවක් සඳහා පියවීමේ මුදලක් ලබාගෙන නොමැති අවස්ථාවන්හිදී, වාණිජකරු විසින්,

(i). EDCT හි ගනුදෙනුව අවලංගු කර "අවලංගු කිරීම" හෝ "ණයට විකුණුම්" ලෙස සඳහන් කරමින් ("අවලංගු කිරීමේ පෝරමය / ආකෘතිය" ලෙස මින් මතුවට හැඳින්වෙන) එකී අවලංගු කිරීමේ පෝරමයෙහි / ආකෘතියෙහි පිටපතක් කාඩ්පත්හිමියා වෙත ලබාදිය යුතුය; සහ

(ii). මුල් අය කිරීම් වාර්තා පෝරමයෙහි / ආකෘතියෙහි පිටපතක් ඉහත සඳහන් කළ "අවලංගු කිරීමේ පෝරමය / ආකෘතිය" ජනනය කර දින හතක් (7) ඇතුලත බැංකුව වෙත ලබාදිය යුතුය.

d. EDCT හරහා මුදල් ආපසු ලබාදීම සිදු වුවහොත්, 12.2 වගන්තියෙහි සඳහන් පරිදි වාණිජකරු විසින් යම් ගනුදෙනුවක් සඳහා පියවීමේ මුදලක් ලබාගෙන ඇති ගනුදෙනුවක් සම්බන්ධයෙන්, එම ගනුදෙනුව ආපසු හැරවීමට (අවලංගු කිරීමට අවශ්‍ය අය කිරීම් වාර්තා පෝරමයෙහි / ආකෘතියෙහි පිටපතක් සමගින්) වාණිජකරු විසින් වහාම බැංකුව වෙත ලිඛිතව දැනුම් දිය යුතු අතර, කාඩ්පත්හිමියා වෙත එම මුල් ලිපියෙහි පිටපතක් ලබාදිය යුතුය.

e. ඕනෑම එක අවස්ථාවකදී මුදල් ආපසු ලබා දීමේ පෝරමය / ආකෘතිය හෝ අවලංගු කිරීමේ පෝරමය / ආකෘතිය පමණක් බැංකුව වෙත ලබාදී ඇත්නම්, වාණිජකරු එම අවස්ථාවේදීම ආපසු ලබාදිය යුතු මුදල් ප්‍රමාණය (උදා: කාඩ්පත්හිමියා/යන් වෙත ආපසු ගෙවිය යුතු මුළු මුදල (මුදල්) වට්ටම අඩු කොට බැංකුව වෙත ගෙවිය යුතුය.

12.4 ගනුදෙනු තොරතුරු ඉදිරිපත් කිරීම මගින්, වාණිජකරු පහත කරුණු වෙනුවෙන් ඉදිරිපත් වීම, වගකීමක් දැරීම හා බැංකුව සමග එකඟ වීම සිදු වේ.

a. එහි සඳහන් කර ඇති සියලුම කරුණු අඩංගු ප්‍රකාශයන් වාණිජකරුගේ දැනුමට අනුව සත්‍ය හා සම්පූර්ණ වේ.

b. ගනුදෙනු විස්තරවලට අදාළ සහ මෙහි සඳහන් කර ඇති අගයට සරිලන මිලට එහෙත් ඊට ඉහළ මිලක් නොවන හෝ වෙනත් ආකාරයකින් අවම මිලක් නොවන භාණ්ඩ සහ / හෝ සේවාවන් වාණිජකරු විසින් මුදලට සපයා හෝ සැපයීමට නියමිතව පැවතිය යුතුය.

c. භාණ්ඩ සහ / හෝ සේවාවන් හා සම්බන්ධව වෙනත් කිසිඳු විකුණුම් ස්ලිප් (කසච) පතක් හෝ තොරතුරු වාණිජකරු විසින් මුදල් වෙනුවට නිකුත් කිරීම හෝ ඉදිරිපත් කිරීම සිදු නොවිය යුතුය.

d. ගනුදෙනු තොරතුරු හා සම්බන්ධ භාණ්ඩ සහ / හෝ සේවාවන් සැපයීම සඳහා ණය සැපයීම නීති විරෝධී නොවිය යුතුය.

e. ගනුදෙනු තොරතුරු සියල්ල, සත්‍ය / වශයෙන්ම වාණිජකරු විසින් සිදු කරනු ලැබූ ගනුදෙනුවක් හා සම්බන්ධ විය යුතු බව සහ

f. වාණිජකරු මෙම ගිවිසුමට අනුකූල වී සිටිය යුතුය.

12.5 කිසියම් ගනුදෙනු තොරතුරක් බැංකුව වෙත ලැබීම හෝ බැංකුව මගින් කරන ලද කුමන හෝ ගෙවීමක් හෝ වෙනත් ක්‍රියාවක් හෝ අතපසු කිරීමක් (බැංකුව විසින් කරනු ලබන ලිඛිත ප්‍රකාශිත පිළිගැනීමක් හෝ ඒ අනුව බැංකුව විසින් කරන ලද ගාස්තු ඉවත් කිරීමක් හැර) වාණිජකරු විසින් ඉහත 12.4 වගන්තියෙහි විශේෂිතවම සඳහන් කරන ලද වගකීම් කිසිවක් හෝ මෙම ගිවිසුමෙහි වෙනත් ඕනෑම නියමයක් හා අනුකූලව වාණිජකරු විසින් පිළිගනු ලැබූවක් හෝ ඉවත් කිරීමක් වශයෙන් ස්ථාපිත වීම හෝ ස්ථාපිත වූ බවට සැලකීම සිදු නොවේ.

**13. ගෙවීම්**

13.1 ගනුදෙනු තොරතුරුවල හෝ පියවිය යුතු මුදලෙහි දක්වා ඇති පරිදි වාණිජකරු වෙත හිඟව පවතින ශුද්ධ මුළු මුදල වාණිජකරු හට බැංකුව මගින් පහත අකාරයන්ගෙන් ගෙවීම් ලබාගත හැක.

a. පසුදින ගෙවීමේ සැලැස්ම - මෙමගින් ගනුදෙනු තොරතුරු ලැබීමෙන් හෝ පියවිය යුතු මුදල ලැබීමෙන් දින එකක් (1) ඇතුලත බැංකුව විසින් වාණිජකරු වෙත ගෙවීම් සිදු කිරීම හෝ

b. තුන් දින ගෙවීමේ සැලැස්ම - මෙමගින් ගනුදෙනු තොරතුරු ලැබීමෙන් හෝ පියවිය යුතු මුදල ලැබීමෙන් දින තුනක් (3) ඇතුලත බැංකුව විසින් වාණිජකරු වෙත ගෙවීම් සිදු කිරීම හෝ

c. දින හතෙහි ගෙවීමේ සැලැස්ම - මෙමගින් ගනුදෙනු තොරතුරු ලැබීමෙන් හෝ පියවිය යුතු මුදල ලැබීමෙන් දින හතක් (7) ඇතුලත බැංකුව විසින් වාණිජකරු වෙත ගෙවීම් සිදු කිරීම හෝ

d. දීර්ඝ කරන ලද ගෙවීමේ සැලැස්ම - මෙමගින් ගනුදෙනු තොරතුරු ලැබීමෙන් හෝ පියවිය යුතු මුදල ලැබීමෙන් දින විසි අටක් (28) ඇතුළත බැංකුව විසින් වාණිජකරු වෙත ගෙවීම් සිදු කිරීම හෝ

e. මෙම පාර්ශවයන් මගින් එකඟ වනු ලබන එවැනි වෙනත් ගෙවීමේ සැලැස්මක්

13.2.1 අදාළ ගෙවීමේ සැලැස්ම යටතේ බැංකුව විසින් ගෙවීම සිදුකළ යුතු දිනය, බැංකු වැඩ කරන දිනයක් (ව්‍යාපාරික දිනයක්) නොවන දිනයක් වන්නේ නම් බැංකුව විසින් එම ගෙවීම ඊළඟ වැඩ කරන දිනයේදී ගෙවනු ලැබේ.

13.2.2 වාණිජකරු විසින් ගෙවීමට නියමිත වට්ටම, බැංකුවෙහි එකඟතාවය මත වාණිජකරු විසින් තෝරා ගනු ලැබූ ගෙවීමේ සැලැස්මෙහි වෙනත් දේ මත රඳා පවතී.

13.2.3 බැංකුව විසින් වාණිජකරු වෙත සිදු කරනු ලබන ගෙවීම්, වාණිජකරු විසින් බැංකුවෙහි පවත්වා ගෙන යනු ලබන ගිණුම වෙත හෝ වාණිජයකරු විසින් බැංකුව වෙත ලිඛිතව දැනුම්දී ඇති වෙනත් ගිණුමකට හෝ කලින් කලට පාර්ශවයන් දෙක විසින් ලිඛිතව එකඟතාවයකට පැමිණ ඇති එවැනි වෙනත් ගිණුමක් වෙත බැර කරනු ඇත.

13.2.4 බැංකුව විසින් සිදු කරනු ලබන ගෙවීම් වාණිජකරුට එරෙහිව බැංකුවට පවතින කිසිඳු හිමිකම්පෑමකට හෝ අයිතිවාසිකමකට අගතියකින් තොරව සිදුකළ යුතු අතර, මෙම ගිවිසුම යටතේ වාණිජකරුගේ වගකීම් ඉටු කිරීම සම්බන්ධයෙන් සහ වාණිජකරු වෙත ගෙවීමට නියමිත මුදල් සම්බන්ධයෙන්බැංකුව විසින් කිසිඳු පිළිගැනීමක් සිදු නොකරයි.

13.2.5 බැංකුව විසින් පහත අවස්ථාවන්හිදී අදාළ මුදල් වාණිජකරුගේ ගිණුමට හර කර වාණිජකරු වෙත හිඟව පවතින ඕනෑම ගෙවීමක් පියවා ගැනීමට හෝ හර කර ගැනීමට හෝ වාණිජකරුගෙන් ක්ෂණික ප්‍රතිපූර්ණයක් (ආපසු ගෙවීමක්) ලබා ගැනීමට කටයුතු කරනු ඇත.

a. ඉහත 12.3 වගන්තියෙහි දක්වා ඇති මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාපටිපාටියට අනුකූලව ඕනෑම කාඩ්පත්හිමියෙකු වෙත සිදුකළ යුතු ආපසු ගෙවීමක් හේතුවෙන් ගෙවිය යුතු මුදලක් වේ නම්;

b. ගණිතමය දෝෂයන් නිසාවෙන් හෝ වෙනත් ආකාරයකින් බැංකුව විසින් වාණිජකරු වෙත වැඩිපුර ගෙවීමක් සිදුකර ඇත්නම්;

c. වෙනත් ඕනෑම මුදලක් වාණිජකරු විසින් බැංකුව වෙත හිඟව හෝ ගෙවිය යුතුව පවතී නම්;

d. බැංකුවෙහි අභිමතය පරිදි, නිශ්චිත කාල සීමාවක් තුළ මෙම ගිවිසුම යටතේ ඉදිරිපත් නොකෙරෙන කිසියම් ගනුදෙනු තොරතුරු හෝ මුදල් ආපසු ගෙවීම හා අදාළ තොරතුරු මත නියමිත දින සිට ගෙවීම් සිදුකළ යුතු දිනය දක්වා (එමෙන්ම යම් ඉල්ලීමක් හෝ තීන්දුවක් ලබා ගැනීමෙන් පසුව හා පෙර) ඔවුන්ගේ ණයගැතිභාවය වෙනුවෙන් කාඩ්පත්හිමියාගෙන් අය කරනු ලබන පොලී අනුපාතයට අනුව පොලියට සමාන මුදලක් වේ නම්,

13.3 වාණිජකරු විසින් මෙම ගිවිසුම උල්ලංඝනය කර ඇති බවට හෝ බැංකුවට එරෙහිව වංක ක්‍රියාවක් හෝ වංචාවක් සිදුකර ඇති බවට සාධාරණ හේතු මත බැංකුව සැක කරන්නේ නම්, බැංකුව විසින් සිදු කරනු ලබන ඊට අදාළ පරීක්ෂණයක් අවසන් කරන තෙක් බැංකුවට මෙම ගිවිසුම යටතේ වාණිජකරු වෙත සිදු කිරීමට ඇති සියලුම ගෙවීම් අත්හිටුවීමට අයිතිය පවතී. .

13.4 වාණිජකරු වෙත සිදු කරනු ලබා පූර්ව ලිඛිත දැනුම්දීමක් සහිතව කලින් කලට අදාළ වට්ටම් / කොමිස් අනුපාතය වෙනස් කිරීමේ අයිතිය බැංකුව රඳවා තබා ගනී.

**14. කාඩ්පත්හිමියන් සඳහා වන ගාස්තු**

ඕනෑම මිල වැඩි කිරීමක් හෝ වෙනත් හේතුවක් නිසාවෙන් හෝ කාඩ්පත භාවිත කිරීම හා සම්බන්ධ ගනුදෙනුවකට අදාළ වන වෙනත් ගාස්තුවක් ගෙවීම සඳහා වාණිජකරු විසින් කිසිඳු කාඩ්පත්හිමියෙකු වෙනුවෙන් අධිභාරයක් ගෙවීමට හෝ වාණිජකරු විසින් ගෙවිය යුතු වට්ටම්වලින් කොටසක් ගෙවීමට අවශ්‍ය නොවේ.

**15. ආපසු අය කිරීම**

පහත සඳහන් අවස්ථාවන්ද ඇතුලත්ව, එහෙත් ඊට සීමා නොවී වාණිජකරු වෙත සිදුකළ යුතු ගෙවීම් සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ගෙවීම ප්‍රතික්ෂේප කිරීමට සහ / හෝ එම අදාළ මුදල් ප්‍රමාණය වාණිජකරුගේ ගිණුමට හර කිරීමට සහ / හෝ මෙම ගිවිසුමෙහි කිසියම් කොන්දේසි හා නියමයන් වාණිජකරු විසින් උල්ලංඝනය වූ අවස්ථාවකදී වාණිජකරුට දැනටමත් ගෙවා ඇති ඕනෑම මුදලක් සඳහා වාණිජකරුගෙන් වහාම එකී මුදල් ආපසු ලබා ගැනීමට ඕනෑම අවස්ථාවකදී බැංකුවට හිමිකම් ඇත.

a. ගනුදෙනුව ඕනෑම හේතුවක් නිසා නීති විරෝධී හෝ ක්‍රියාත්මක කළ නොහැකි වීම;

b. කාඩ්පත්හිමියාගේ අත්සන සඳහන්ව නොතිබීම;

c. අය කිරීම් වාර්තා පෝරමයෙහි / ආකෘතියෙහි හෝ ගනුදෙනු හා සම්බන්ධ කාඩ්පත්හිමියා විසින් අත්සන් කළ යුතු වෙනත් ඕනෑම ලේඛනයක සඳහන් කාඩ්පත්හිමියාගේ අත්සන ව්‍යාජ එකක් වීම හෝ ලේඛනයෙහි සඳහන් කාඩ්පත්හිමියාගේ අත්සන ගනුදෙනුව සඳහා භාවිත කරන ලද කාඩ්පතෙහි අත්සනට නොගැළපීම;

d. විකුණුම් ස්ලිප් පතෙහි (කසච) පිටපත හෝ වාණිජකරුගේ ඉන්වොයිස් පත හෝ බැංකුව වෙත ඉදිරිපත් කරනු ලැබූ හෝ වාණිජකරු විසින් රඳවා ගනු ලැබූ ගනුදෙනුව හා සම්බන්ධ කාඩ්පත්හිමියා විසින් අත්සන් කළ යුතු වෙනත් ඕනෑම ලේඛනයක් කාඩ්පත්හිමියා වෙත ලබාදුන් ඕනෑම පිටපතකට වඩා වෙනස් වීම.

e. කාඩ්පත්හිමියාගේ ගිණුම් අංකය, අත්හරින ලද හෝ අසම්පූර්ණ හෝ අවලංගු එකක් ලෙස හඳුනා ගැනීම හෝ කාඩ්පත්හිමියාගේ ගිණුම් අංකය අය කිරීම් වාර්තා පෝරමයෙහි කාවැද්දුම් මුද්‍රණයක් ලෙස සටහන්ව නොතිබීම.

f. ගනුදෙනුව සඳහා වාණිජකරු වෙත ඉදිරිපත් කරනු ලැබූ කාඩ්පත වෙනස් කරන ලද හෝ තවමත් වලංගු වී නොමැති හෝ ගනුදෙනුව සිදු කරන අවස්ථාවේදී කල් ඉකුත් වූ කාඩ්පතක් වීම.

g. ගනුදෙනුව සඳහා වාණිජකරු වෙත ඉදිරිපත් කරනු ලැබූ කාඩ්පත කලින් කලට නිකුත් කරනු ලබන හෝ බැංකුව විසින් හෝ ඒ වෙනුවෙන් වාණිජකරු වෙත ලබාදෙනු ලබන අනතුරු ඇඟවීමේ ලැයිස්තුවක හෝ වෙනත් ඕනෑම (කුමන හෝ ආකාරයක) සන්නිවේදන හෝ උපදෙසක් යටතේ ලැයිස්තුගත වී තිබීම.

h. කාඩ්පත්හිමියාගෙන් අය කරනු ලැබූ මුදල වාණිජකරු විසින් මුදලට සපයනු ලැබූ භාණ්ඩවල හෝ ලබාදුන් සේවාවට අදාළ මිලට වඩා ඉහළ වීම.

i. විකුණුම්වලට අදාල මිල වාණිජකරු වෙත ලබා දී ඇති සීමාවට වඩා ඉහළ වන අතර, එම ගනුදෙනුව සඳහා බැංකුව වෙතින් කිසිඳු පූර්ව අවසරයක් ලබාගෙන නොමැති වීම.

j. ගනුදෙනුව මගින් ආවරණය වන භාණ්ඩ සහ / හෝ සේවාවන් ප්‍රතික්ෂේපිත හෝ නැවත හරවා එවන ලද හෝ ගනුදෙනුව හෝ ඉන් කොටසක් කාඩ්පත්හිමියා විසින් අවලංගු කරන ලද / අහෝසි කරන ලද / අවසන් කරන ලද හෝ කාඩ්පත්හිමියා වෙත සම්පූර්ණ වශයෙන් හෝ කාඩ්පත්හිමියා සෑහීමකට පත්වන ප්‍රමාණයෙන් භාණ්ඩ සහ/හෝ සේවාවන් සැපයීමට වාණිජකරු අසමත් වීම.

k. අය කිරීම් වාර්තා පෝරමය / ආකෘතිය හෝ ඉන් ඕනෑම කොටසක් කියවිය නොහැකි හෝ අපැහැදිලි, අසම්පූර්ණ හෝ අත්සන් නොකළ එකක් වීම හෝ මෙම ගිවිසුමට අනුකූලව සකස් කරන ලද හෝ සම්පූර්ණ කරන ලද හෝ භාර දෙනු ලැබූ එකක් නොවීම.
l. ගනුදෙනුව මගින් ආවරණය වන භාණ්ඩ සහ / හෝ සේවාවන් ගේ ගුණාත්මකභාවය හෝ ප්‍රමාණය කාඩ්පත්හිමියා විසින් මතභේදයට බඳුන් කරනු ලබයි නම්.
m. ගනුදෙනුවට අදාළව ඉලෙක්ට්‍රොනිකව (විද්‍යුත් මාර්ගයක් මගින්) බැංකුව වෙත ඉදිරිපත් කරන ලද කිසියම් තොරතුරක් මෙම ගිවිසුමට අනුකූලව නොලැබීම.
n. ගනුදෙනුව හා සම්බන්ධව 22 වන වගන්තියට අනුකූලව, බැංකුව විසින් ඉල්ලා ඇති සාක්ෂි වාණිජකරු විසින් ලබාදීමට අපොහොසත් වීම.
o. ගනුදෙනුව හා සම්බන්ධව ඉදිරිපත් කළ යුතු ගනුදෙනු තොරතුරු, එකඟ වූ කාල සීමාව තුළදී බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබීම.
p. කාඩ්පත්හිමියා විසින් හේතුවක් සහිතව ගනුදෙනුව මගින් ආවරණය වන ගනුදෙනුව හෝ භාණ්ඩ සහ / හෝ සේවාවන් සම්බන්ධයෙන් වන ගනුදෙනුව හෝ විකුණුම හෝ භාණ්ඩ ගෙනවිත් භාර දීම මතභේදයට ලක්කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම.
q. ගනුදෙනුවක් සඳහා අවසර ඉල්ලා සිටීමේදී වාණිජකරු විසින් වැරදි කාඩ්පත්හිමියෙකුගේ නමක් හෝ කාඩ්පත් අංකයක් බැංකුවට ලබාදී තිබීම.
r. වාණිජකරු විසින් අය කිරීම් වාර්තා පෝරමයක / ආකෘතියක වැරදි පිටපතක් භාරදීම හේතුවෙන් ගනුදෙනුව කාඩ්පත්හිමියාගේ ගිණුමට කිහිප වතාවක් අයකර තිබීම.
s. ගනුදෙනු අක්‍රමවත් බව බැංකුව විසින් ප්‍රමාණවත් තරමින් විශ්වාස කිරීම.
t. ගනුදෙනුව වටා සැක සහිත තත්ත්වයන් පවතින බව බැංකුවේ මතය ලෙස පැවතීම.
u. වාණිජකරු විසින් ගනුදෙනු තොරතුරු ඉදිරිපත් කිරීම සාමාන්‍ය රටාවෙන් බැහැරව පවතින බව බැංකුවේ මතය ලෙස පැවතීම.
v. වාණිජකරු විසින් ඉදිරිපත් කරනු ලබන විකුණුම් ස්ලිප් පත්‍ (කසව) වලට ගරු කිරීමට, නිකුත් කරනු ලබන බැංකුව විසින් ප්‍රතික්ෂේප කිරීම.
w. මෙහි සඳහන් 7.1 වගන්තිය නොතකා, ගනුදෙනුවෙහි තත්ත්වයන් කොතරම් සැක සහිතද යන්න , කාඩ්පත ව්‍යාජ එකක් හෝ සොරකම් කරන ලද එකක් බවට වාණිජකරු විසින් තේරුම් ගනිමින් ගනුදෙනුව ප්‍රතික්ෂේප කළ යුතුව පැවතීම.

**16. වාණිජකරුගේ නම භාවිතය**

කාඩ්පත පිළිගැනීම ඇතුළුව බැංකුවෙහි නිෂ්පාදන හා සේවාවන් සම්බන්ධව නිපදවන ඕනෑම නාමාවලියක හෝ ප්‍රවර්ධන මාධ්‍යයක වාණිජකරුගේ නම ඇතුලත් කිරීමට වාණිජකරු විසින් අහෝසි කළ නොහැකි ලෙස බැංකුවට බලය පවරයි.

**17. සංකේත සහ නම් ප්‍රදර්ශනය**

සාමාන්‍ය මහජනතාව වෙත තම වාණිජ ආයතනය මගින් අදාළ කාඩ්පත් වර්ගය සඳහා ගරු කරන බව දැනුම් දීම සඳහා වාණිජකරු විසින් බැංකුවෙහි දැනට කාඩ්පත්වල පවතින සංකේත සහ නාමයන් මෙන්ම බැංකුව විසින් පමණක් සපයනු ලැබූ ප්‍රවර්ධන මධ්‍යයන් ඇතුළුව එවැනි සංකේත සහ ද්‍රව්‍ය ප්‍රදර්ශනය කළ හැක. එවැනි සංකේත සහ ද්‍රව්‍ය සහ නාමයන් භාවිත කිරීම සහ ප්‍රදර්ශනය කිරීම සඳහා වන අයිතිය, මෙම ගිවිසුම ක්‍රියාත්මක වන තාක් කල් හෝ බැංකුව විසින් වාණිජකරු හට මෙම සංකේත හෝ නාමයන් භාවිතය හෝ ප්‍රදර්ශනය නතර කළ යුතු බවට දැනුම් දෙන තාක් නොකඩවා හිමි වේ.

**18. වාණිජකරු සඳහා වන වට්ටම් අනුපාතය**

වට්ටම් අනුපාතය බැංකුව විසින් කලින් කලට දැනුම් දෙනු ඇති අතර, වාණිජකරු වෙත ලබාදෙනු ලබන දැනුම් දීමකින් වෙනස් වීමකට යටත් විය හැක.

**19. වාණිජකරු සඳහා වන ණය සීමාව**

වාණිජකරු සඳහා වන ණය සීමාව (සීමාවන්) බැංකුව විසින් කලින් කලට දැනුම් දෙනු ඇති අතර, වාණිජකරු වෙත ලබාදෙනු ලබන දැනුම් දීමකින් වෙනස් වීමකට යටත් විය හැක. එවැනි දැනුම් දීමක් සිදු නොවුනේ නම්, වාණිජකරු සඳහා වන ණය සීමාව බින්දුවක් (0) වේ.

**20. ගනුදෙනුවක් සඳහා වන අවම වටිනාකම**

වලංගු කාඩ්පතක් නොවන අවස්ථාවකදී හැර, වාණිජකරු විසින් කාඩ්පත පිළිගැනීම ප්‍රතික්ෂේප කරනු ලබන අවම ගනුදෙනු වටිනාකමක් වාණිජකරු සඳහා අවශ්‍ය නොවන අතර, එවැනි සංඥා ප්‍රදර්ශනය කළ යුතු නොවේ.

**21. ගිවිසුම උල්ලංඝනය කරමින් සිදු කරනු ලැබූ ගනුදෙනු**

මෙම ගිවිසුමෙහි අංක 30 වගන්තිය යටතේ, ගිවිසුම අවසන් කිරීමට බැංකුවට ඇති අයිතියට අගතියකින් තොරව, වාණිජකරු විසින් මෙම ගිවිසුමෙහි සඳහන් ඕනෑම කොන්දේසියක් හෝ නියමයක් උල්ලංඝනය කිරීම හේතුවෙන් ඇති වූ තත්ත්වයක් වෙනුවෙන් කාඩ්පත්හිමියා ඉල්ලුම් කරනු ලබන ඕනෑම මුදලක් වාණිජකරුගේ ගිණුමට හර කිරීමට හෝ වාණිජකරු වෙත ගෙවීමට නියමිත ඕනෑම ගෙවීමකින් හෝ නැවත පියවීමකින් එය අඩුකර ගැනීමට බැංකුවට බලය පැවරේ. වාණිජකරු හට බැංකුව සමග ගිණුමක් නොපවතින අවස්ථාවකදී හෝ ගිණුමෙහි ප්‍රමාණවත් මුදලක් නොවපතින අවස්ථාවකදී වාණිජකරු විසින් බැංකුවෙහි ඉල්ලීම මත වහාම බැංකුව වෙනුවෙන් එම අය විය යුතු මුදල බැංකුව වෙත ගෙවිය යුතුය.

සැකසහිත භාවය මගහැරවීම සඳහා, මෙම වගන්තිය යටතේ වාණිජකරුගෙන් ගෙවීමක් ඉල්ලා සිටීමට බැංකුවට ඇති හැකියාව පිළිබඳ, මෙම ගිවිසුම අවසන් වීමෙන් පසුවත්, ගිවිසුම අවසන් වීමෙන් පසු ඕනෑම වේලාවකදී කාඩ්පත්හිමියන් විසින් කරන ලද හිමිකම් සම්බන්ධයෙන් වාණිජකරු විසින් පැහැදිලිවම ප්‍රකාශිතවම එකඟ වේ.

**22. සාක්ෂි සහ ලේඛන**

22.1 බැංකුවෙහි ඉල්ලීම මත වාණිජකරු විසින් වහාම (කාඩ්පත්හිමියා විසින් එය විවාදයට ලක් කළද නොකළද) කාඩ්පත්හිමියාගේ කාඩ්පත් ගිණුම ඕනෑම ගනුදෙනු මුදලක් සඳහා හර කරමින් ගනුදෙනුව සිදුකිරීම (එහෙත් ඉහත සඳහන් කිසිවකට අගතියකින් තොරව) පිළිබඳ කාඩ්පත්හිමියාට ඇති බලය හා සම්බන්ධව බැංකුව වෙත බැංකුව සෑහීමකට පත්වන පරිදි ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කර එක් එක් ගනුදෙනුවට අදාළ සියලුම ලියකියවිලි සහ වාර්තා ඉන් පසුව මාස දහඅට (18)කට නොඅඩු කාලයක් සඳහා රඳවා තබා ගනු ඇති අතර, බැංකුවෙහි ඉල්ලීම මත ඒවා ලබා දෙනු ඇත.

22.2 බැංකුව විසින් වරින් වර ඉල්ලුම් කරන පරිදි ඕනෑම ගනුදෙනුවක් සම්බන්ධයෙන් වංචා වැළැක්වීම හා ඒවා අනාවරණය කර ගැනීම වෙනුවෙන් වාණිජකරු විසින් සාධාරණ අයුරින් සහය දැක්විය යුතුය.

**23. උපකරණ සහ / හෝ කාවැද්දුම් මුද්‍රණ යන්ත්‍රය (යන්ත්‍ර) නඩත්තු කිරීම**

23.1 බැංකුව විසින් සපයනු ලැබූ උපකරණ,

a. වාණිජකරු විසින් අදාළ උපකරණ උසස් තත්වයෙන් පවත්වාගෙන යා යුතුය;
b. උපකරණ භාවිතයේදී ඒවා ආරක්ෂිතව තබාගැනීම සහ පාලනය කිරීම වාණිජකරු සතු පූර්ණ වගකීම වේ. එම උපකරණ භාවිතය වාණිජකරු විසින් බලය පවරන ලද බවට සහ අනුමත කරන ලද බවට සැලකේ.;
c. බැංකුව සහ වාණිජකරු අතර, උපකරණ භාවිත කරන සියලුම පුද්ගලයින් වාණිජකරුගේ නියෝජිතයින් ලෙස සලකනු ලැබේ. වාණිජකරු සහ එහි නියෝජිතයින් හෝ ගනුදෙනුකරුවන් අතර පැන නගින ඕනෑම ආකාරයේ මතභේදයක් සඳහා බැංකුව විසින් වග කියනු නොලැබේ. උපකරණය භාවිතයෙන් හෝ අවභාවිතයෙන් ඇතිවන ප්‍රතිඵලයක් ලෙස බැංකුව වෙත දැරීමට සිදුවන, ඇතිවන හෝ පවත්වාගෙන යන සියලුම ඉල්ලීම්, පාඩු, පිරිවැය, වියදම් සහ වගකීම් සඳහා වාණිජකරු වෙත වන්දිපූරණය කරනු ලබයි;
d. වාණිජකරු වෙත සපයනු ලබන ඕනෑම උපකරණයක් බැංකුවට අයත් දේපල ලෙස පවතින අතර, බැංකුව විසින් සිදු කරනු ලබන ඉල්ලීමකදී ඒවා නැවත බැංකුව වෙත භාර දිය යුතුය;
e. එමෙන්ම, උපකරණය භාවිතය සම්බන්ධයෙන් වංචා වැළැක්වීම සහ ඒවා අනාවරණය කර ගැනීම සඳහා වාණිජකරු විසින් වගකීමෙන් යුතුව සහාය දැක්විය යුතුය;
f. වාණිජකරු විසින් උපකරණ අනිසි ලෙස හැසිරවීම හේතුවෙන් එම උපකරණවලට හානි සිදු වී ඇත්නම්, එම උපකරණවල පිරිවැය සහ / හෝ උපකරණ අලුත්වැඩියා කිරීමේ පිරිවැය බැංකුව විසින් වාණිජකරුගෙන් අය කරනු ඇත.
g. මෙම ගිවිසුම අවසන් කරනු ලබන අවස්ථාවකදී හෝ ඕනෑම හේතුවක් මත වාණිජකරු විසින් වෙළෙඳාම් කිරීම නවතා දමනු ලබන අවස්ථාවකදී හෝ බැංකුව විසින් එසේ භාරදීමට ඉල්ලීම් කරන අවස්ථාවකදී වහාම සියලුම උපකරණ බැංකුව වෙත නැවත භාරදිය යුතුය.

23.2 බැංකුව විසින් සපයනු ලැබූ උපකරණ,

a. උපකරණ විකිණීම, පැවරීම, මාරු කිරීම, බදු දීම හෝ වෙනත් ආකාරයකින් එවැන්නක් සිදු කිරීම හෝ සිදු වීමට සැලසීම හෝ ඉඩ දීම හෝ ඉඩ දීමට උත්සාහ කිරීම, උපකරණය හා සම්බන්ධව ඕනෑම ගනුදෙනුවක් සිදු කිරීම, උපකරණය පිළිබඳ ඕනෑම අවහිරයක් සිදු කිරීම.
b. බැංකුව වෙත උපකරණ පිළිබඳ ඇති හිමිකම පිළිබිඹු කරනු ලබන උපකරණය සමග ඇති ඕනෑම සලකුණක්, ඇමුණුමක්, සඳහනක් හෝ ආලේපනයක් ඉවත් කිරීම, සැඟවීම හෝ වෙනස් කිරීම හෝ
c. උපකරණ වෙත ප්‍රවේශ වීමට, ඒවා නැවත ලබා ගැනීමට හෝ බැහැර කිරීමට හෝ වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධව බැංකුවට ඇති අයිතියට බලපෑම් ඇති කරනු ලබන ඕනෑම ක්‍රියාමාර්ගයක් සිදු වීමට සැලසීම හෝ ඉඩ දීම හෝ ගනුදෙනුකරුවෙකුගේ හෝ වාණිජ ස්ථානයෙහි සේවකයෙකුගේ හෝ නියෝජිතයින්ගේ කවර හෝ ක්‍රියාවක් මගින් හෝ එහි පාලනය තුළ පවතින වෙනත් සාධකයක් මගින් උපකරණය අවහිර කර ගැනීම හෝ යම් ආකාරයකින් අනතුරකට ලක් කිරීම.

23.3 මෙහි සඳහන් 26 වන වගන්තියෙහි විධිවිධානවලට යටත්ව, බැංකුව විසින් සපයනු ලැබූ උපකරණ හා සම්බන්ධව, එම උපකරණ සඳහා සිදු කිරීමට අවශ්‍ය ඕනෑම සේවාවක්, අලුත්වැඩියාවක් හෝ ප්‍රතිස්ථාපනයක් සඳහා බැකුව විසින් වගකියනු ලැබේ. මෙම අවශ්‍යතාවය සඳහා වාණිජකරු විසින් බැංකුවට, එහි නියෝජිතයින්ට, කොන්ත්‍රාත්කරුවන්ට හෝ අනුයෝජිතයෙකු හට සෑමවිටම උපකරණය වෙත ප්‍රවේශ වීමේ අවස්ථාව සලසා දිය යුතුය.

23.4 බැංකුව විසින් ලබාදෙනු ලබන පෙර ලිඛිත අවසරයකින් තොරව බැංකුව විසින් සපයා ඇති උපකරණ නඩත්තු කිරීමේ සේවාවන් සිදු කිරීමට හෝ එකී උපකරණ සඳහා වෙනස්කම් සිදු කිරීමට හෝ යාන්ත්‍රික වෙනස්කම් සිදු කිරීමට කිසිඳු තුන්වැනි පාර්ශවයකට වාණිජකරු විසින් අවසර ලබා නොදිය යුතුය.

**24. ව්‍යාපාරය ඉවත් කිරීම හා අත්හිටුවීම**

තමා සතු ඕනෑම ආයතනයක් වසා දමනු ලබන සහ / හෝ ව්‍යාපාරය වෙනත් පුද්ගලයෙකු වෙත මාරු කරන හෝ විකුණනු ලබන අවස්ථාවකදී එලෙස වසා දැමීමක් සහ / හෝ ව්‍යාපාරය වෙනත් පුද්ගලයෙකු වෙත මාරු කිරීමක් හෝ විකිණීමක් බලාත්මක වන දිනයට වැඩ කරන දින තිහකට (30) පෙර වාණිජකරු විසින් ඒ බව බැංකුව වෙත දැනුම් දිය යුතුය. ප්‍රමාණවත් මුදලක් නොවපතින අවස්ථාවකදී වාණිජකරු විසින් බැංකුවෙහි ඉල්ලීම මත වහාම බැංකුව වෙනුවෙන් එම අය විය යුතු මුදල බැංකුව වෙත ගෙවිය යුතුය.

සැකසහිත භාවය මගහැරවීම සඳහා, මෙම වගන්තිය යටතේ වාණිජකරුගෙන් ගෙවීමක් ඉල්ලා සිටීමට බැංකුවට ඇති හැකියාව පිළිබඳ, මෙම ගිවිසුම අවසන් වීමෙන් පසුවත්, ගිවිසුම අවසන් වීමෙන් පසු ඕනෑම වේලාවකදී කාඩ්පත්හිමියන් විසින් කරන ලද හිමිකම් සම්බන්ධයෙන් වාණිජකරු විසින් පැහැදිලිවම ප්‍රකාශිතවම එකඟ වේ.

**25. අනාවරණය කිරීම**

වාණිජකරුගේ ගිණුමට අදාළ ඕනෑම තොරතුරක් හෝ එය හසුරුවන අයුරු, වාණිජකරුගේ විස්තර හා සබඳතා (මූල්‍ය සහ වෙනත්) පිළිබඳ ඕනෑම පුද්ගලයෙකු, සංස්ථාවක්, බැංකු මූල්‍ය ආයතනයක්, බැංකුවෙහි ඕනෑම ශාඛාවක් සහ අදාළ සමාගම්ද ඇතුලත්ව එහෙත් ඊට සීමා නොවී, ඕනෑම පාර්ශවයක් වෙත අනාවරණය කිරීමට සහ එවැනි තොරතුරු ඕනෑම පාර්ශවයකින් ලබා ගැනීමට වාණිජකරු විසින් මෙමගින් බැංකුව වෙත බලය පවරනු ලැබේ.

**26. අයිතිය අත්හැරීමේ ප්‍රකාශය**

26.1 බැංකුවෙහි සම්පූර්ණ නොසැලකිල්ල සහ හිතාමතා පැහැරහැරීම හේතු කොටගෙන හැර වෙනත් කිසිඳු අවස්ථාවකදී, විකුණුම් සිදු කරනු ලබන අවස්ථාවේදී බැංකුව විසින් අදාළ ගනුදෙනුව සඳහා බලය ලබාදෙනු ලැබීම පිළිබඳ සිදු කරනු ලබන සන්නිවේදනයේ සිදුවන සාවද්‍යභාවයන් හෝ අවලංගුභාවය පිළිබඳ බැංකුව, වාණිජකරුට හෝ වාණිජකරුගේ ගනුදෙනුකරුවෙකු වෙනුවෙන් කිසිඳු වගකීමක් නොදරනු ඇති අතර, එවැනි ඕනෑම හිමිකමක් වෙනුවෙන් වාණිජකරු විසින් බැංකුව වෙත වන්දිපූරණය කළ යුතුය.

26.2 මෙම ගිවිසුමට පටහැනිව පැහැදිලිවම සපයනු ලැබූ ඒවා හැර, ප්‍රකාශිත, ව්‍යංග, ව්‍යවස්ථාපිත හෝ වෙනත් ආකාරයකින් පද්ධතිය වෙත සම්බන්ධ වන සියලුම නියමයන්, කොන්දේසි, වගකීම්, භාරදීම් හෝ නිරූපනයන් බැහැර කර ඇත. ඉහත කී වාක්‍යයෙහි පොදුභාවය සීමා නොකර, බැංකුව විසින් කිසිඳු අලාභයක් හෝ හානියක් (ප්‍රතිවිපාක ලෙස ඇති වන අලාභ හෝ හානිද ඇතුළුව), කෙසේ වුවද එය වාණිජකරු විසින් ඇතිකළ හැකි හෝ උපකරණය සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රව පැනනැගිය හැකි හෝ උපකරණ පද්ධතියෙහි බිඳ වැටීමක් හෝ දෝෂයක් හේතුවෙන් සිදු විය හැකි අතර, ඒ සම්බන්ධයෙන් වාණිජකරු වෙත කිසිදු ආකාරයකින් වගකියනු නොලැබේ.

**27. වන්දි පූරණය**

27.1 පහත සඳහන් කරුණු හා සම්බන්ධව, සෘජුව හෝ වක්‍රව බැංකුවට විඳීමට හෝ දැරීමට සිදුවන කිසියම් ක්‍රියාවක්, හිමිකමක්, පිරිවැයක්, හානියක්, ඉල්ලීමක්, වියදමක්, පාඩුවක් සහ වගකීමක් ආදියට එරෙහිව කරනු ලබන ඉල්ලීම මත වාණිජකරු විසින් බැංකුව වෙත වන්දි පූරණය කරනු ඇත.

a. වාණිජකරු විසින් මෙම ගිවිසුමෙහි විධිවිධානවලට අනුකූල වීමට අපොහොසත් වීම සහ / හෝ;
b. වාණිජකරු සහ කාඩ්පත්හිමියා අතර සිදුවන ඕනෑම ගනුදෙනුවක් සහ ඕනෑම හෝ යම් චෝදනාවක් වැරදි ලෙස නිරූපනය කිරීම හෝ කොන්ත්‍රාත්තුව උල්ලංඝනය කිරීම හෝ වාණිජකරු විසින් හෝ වාණිජකරුගේ කුමන හෝ නිලධාරියෙකු, සේවකයෙකු හෝ නියෝජිතයෙකු කාඩ්පත්හිමියා වෙත ඉටුවිය යුතු වෙනත් ඕනෑම රාජකාරියක් උල්ලංඝනය කිරීමද ඇතුළුව එහෙත් ඒවාට අගතියකින් තොරව ක්‍රියා කිරීම;
c. ෆැක්ස් හෝ ඊමේල් හරහා වාණිජකරුගෙන් ලැබුණු උපදෙස් මත බැංකුව ක්‍රියා කිරීම.

27.2 එවැනි ඕනෑම හිමිකම් පෑමකට අදාළව සහ එය පිළිගැනීමට, මතභේදයට ලක් කිරීමට, සම්මුතියකට එළැඹීමට හෝ වෙනත් ආකාරකින් ඒ පිළිබඳ කටයුතු කිරීම හා සම්බන්ධව සියලුම සාකච්ඡා සහ ගිවිස ගැනීම් සිදුකිරීමේ සම්පූර්ණ අයිතිය බැංකුව සතු වන අතර, ඒ පිළිබඳ වාණිජකරු වෙත වගකියනු නොලැබේ. එමෙන්ම බැංකුවට අවශ්‍ය වන ඕනෑම හිමිකමක් හා සම්බන්ධ ඕනෑම සහායක් වාණිජකරු විසින් බැංකුව වෙත ලබාදිය යුතුය.

**28. රහස්‍යභාවය**

28.1 තොරතුරු පිළිබඳ අනාවරණය කිරීම නෛතිකව හෝ අධිකරණ අවශ්‍යතාවයක් සඳහා හැර කාඩ්පත්හිමියා විසින් ලබාදෙනු ලබන ලිඛිත පෙර දැනුම් දීමකින් තොරව වාණිජකරු විසින් කාඩ්පත්හිමියාගේ කුමන ආකාරයකින් හෝ ලබාගත් හෝ කුමන හෝ ආකාරයකින් පවතින තොරතුරු හෝ ඔහුගේ / ඇයගේ ගනුදෙනු භාවිත කිරීම හෝ ඕනෑම තුන්වැනි පාර්ශවයක් (ගනුදෙනුව සම්පූර්ණ කිරීමට හෝ බලාත්මක කිරීමට වාණිජකරුට සහාය වීමේ පරම අරමුණ සහිත වාණිජකරුගේ නියෝජිතයින්ට සහ වාණිජකරුගේ රක්ෂණකරුවන්ට සහ වෘත්තීය උපදේශයින්ට හැර) වෙත අනාවරණය කිරීම සිදු නොකළ යුතුය.

28.2 ඒ පිළිබඳ අනාවරණය කිරීම නෛතිකව හෝ අධිකරණ අවශ්‍යතාවක් සඳහා හැර බැංකුව විසින් ලබාදෙනු ලබන ලිඛිත පෙර දැනුම් දීමකින් තොරව වාණිජකරු විසින් කුමන ආකාරයකින් හෝ ලබාගත් හෝ කුමන හෝ ආකාරයකින් පවතින බැංකුකරණය හා අදාළ හෝ පද්ධති පිළිබඳ හෝ මෙම ගිවිසුම පිළිබඳ තොරතුරු භාවිත කිරීම හෝ කිසිදු තුන්වැනි පාර්ශවයක් (ගනුදෙනුව සම්පූර්ණ කිරීමට හෝ බලාත්මක කිරීමට වාණිජකරුට සහාය වීමේ පරම අරමුණ සහිත වාණිජකරුගේ නියෝජිතයින්ට සහ වාණිජකරුගේ රක්ෂණකරුවන්ට සහ වෘත්තීය උපදේශයින්ට හැර) වෙත අනාවරණය කිරීම නොකළ යුතුය.

**29. ගිණුම් අංක තොරතුරු**

කාඩ්පතක් මත සිදුකරනු ලැබූ ගනුදෙනුවක් මගින් ලබාගත් කාඩ්පත්හිමියාගේ නම හෝ කාවැද්දුම් මුද්‍රණ සහිත අය කිරීම් වාර්තා පෝරමවල ඇතුලත් කාඩ්පත් ගිණුම් තොරතුරු, අය කිරීම් වාර්තා පෝරමයෙහි කාබන් පිටපත්, තැපැල් ලැයිස්තු, තැටි හෝ වෙනත් මාධ්‍යයකින් වාණිජකරුහට තම ව්‍යාපාරය සඳහා, බැංකුවට, කාඩ්පත් නිකුත්කරන්නා හට බැංකුව හරහා සහාය වීම සඳහා වාණිජකරුගේ නියෝජිතයෙකු වෙත හෝ අධිකරණය මගින් ඉල්ලා සිටි අවස්ථාවකදී හැර වෙනත් තුන්වැනි පාර්ශවයක් වෙත විකිණීම, ලබාදීම හෝ හුවමාරු කිරීම නොකළ යුතුය.

**30. අවසන් කිරීම**

30.1 පහත ආකාරයට මෙම ගිවිසුම අවසන් කරනු ඇත.

(i). වාණිජකරු විසින් බැංකුව වෙත අවම වශයෙන් දින තිහකට (30) පෙර ලිඛිතව දැනුම් දීම මගින් හෝ
(ii). බැංකුව විසින් ක්‍රියාවට නංවන ලද සහ පිළිගත් සියලුම ගනුදෙනු සම්බන්ධයෙන් නිසි පරිදි සම්පූර්ණ කිරීම සහ ගෙවීම පිළිබඳ අගතියකින් තොරව ගිවිසුම අවසන් කරනු ලබන දිනයේදී හෝ ඊට පෙර බැංකුව විසින් වහාම අවසන් කිරීම.

ගිවිසුම අවසන් කරන අවස්ථාවකදී, වාණිජකරු විසින් සම්පූර්ණ කරන ලද සියලුම ගනුදෙනු ගිවිසුම අවසන් කරනු ලබන අවස්ථාවේදී බැංකුවෙහි නියෝජිතයා හට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, 12.3, 13.6 සහ 15 යන වගන්තිවලට අනුව, ලැබී ඇති එවැනි සියලුම ගනුදෙනු තොරතුරු සඳහා ගෙවීම් සිදුකරනු ලබන්නේ කාඩ්පත් නිකුත් කරන්නාගෙන් (නිකුත් කරන්නන්ගෙන්) බැංකුව විසින් අදාළ ගෙවීම් සාර්ථකව එකතු කරගැනීමෙන් සහ කිසියම් අවස්ථාවකදී එම ගනුදෙනුවට අදාළ ගනුදෙනු තොරතුරු බැංකුව වෙත ලැබුණු දිනයේ සිට දින 180කට පසුවය. බැංකුව විසින් ඉල්ලා සිටිනු ලබන ඕනෑම ආපසු ගෙවීමක්, වාණිජකරු විසින් ගෙවිය යුතු මුදල ඉක්මවා ගියහොත් එහි වෙනස වාණිජකරුගෙන් බැංකුව වෙත පියවිය යුතු ණයක් බවට පත් වන අතර, එම මුදල වාණිජකරු විසින් වහාම බැංකුව වෙත ගෙවිය යුතුය.

30.2 තම ව්‍යාපාරය වසා දැමීම, වෙනත් පුද්ගලයෙකු වෙත මාරු කිරීම හෝ විකිණීම පිළිබඳ ඉහත 24 වගන්තිය යටතේ වාණිජකරු විසින් බැකුව වෙත දැනුම් දුන් අවස්ථාවකදී, මෙම ගිවිසුමෙහි 24 වන වගන්තිය යටතේ ලබා දීමට අවශ්‍ය යැයි සඳහන් කර ඇති දින තිහක (30) කාලය අවසන් වනවිට ගිවිසුමද අවසන් වේ. එය කෙසේ වුවද, වාණිජකරු විසින් අදාළ උපකරණය බැංකුව වෙත නැවත භාරදෙන තුරු, වාණිජකරු වෙත ලබාදී ඇති උපකරණය හරහා සිදු කරනු ලබන සෑම ගනුදෙනුවක් සඳහාම වාණිජකරු තවදුරටත් වගකිව යුතුය.

30.3 එවැනි ගිවිසුම අවසන් කිරීමකදී වාණිජකරු විසින් වහාම සහ වාණිජකරුගේ වියදමින්, එම උපකරණය සහ අදාළ සියලුම ලිපි ලේඛන බැංකුව වෙත නැවත භාර දිය යුතුය.

30.4 කිසිඳු ගිවිසුම් අවසන් කිරීමක්, එම අවසන් කිරීමට පෙර පැවති වගකීම් හෝ ගිවිසුමෙහි පැවැත්ම සඳහා ප්‍රකාශිත ඕනෑම විධිවිධානයක් හෝ ගිවිසුම අවසන් කිරීමේදී බලපැවැත්වෙන විධිවිධානයක් (නමුත් ඉහත සඳහන් කරුණුවලට අගතියකින් තොරව) සහ 12.3, 13.6, 15, 21, 22, 27 සහ 28 යන වගන්ති සඳහා බලපෑමක් ඇති නොකරනු ලබන අතර, මෙම වගන්තිය, ගිවිසුම අවසන් කිරීම නොතකා පූර්ණ ලෙස ක්‍රියාත්මක වෙමින් බලපැවැත්වෙනු ඇත.

30.5 ගිණුම අවසන් කරනු ලැබූ දිනයෙන් පසුව බැංකුව වෙත ඉදිරිපත් කරනු ලබන ඕනෑම ගනුදෙනුවක්, ඒ සඳහා අවසර ලබා දී ඇති හෝ නැති වුවද, බැංකුව විසින් ගෙවනු නොලැබේ.

**31. පවරා දීම**

31.1 මෙම ගිවිසුම වාණිජකරු විසින් කිසිවෙකු වෙත පවරා දිය නොහැක.

31.2 වාණිජකරු වෙත දැනුම්දී ඕනෑම අවස්ථාවකදී මෙම ගිවිසුම හෝ මෙහි සඳහන් බැංකුවෙහි ඕනෑම බැඳීමක් පවරා දීමට සහ / හෝ මෙහි සඳහන් බැංකුවෙහි ඕනෑම වගකීමක් ඉටු කිරීම සඳහා උප කොන්ත්‍රාත්තුවක් හෝ ඕනෑම නියෝජිතයෙකු පත් කිරීමක් සඳහා බැංකුවට හැකියාව පවතී.

**32. නියෝජනයන්**

මෙම ගිවිසුමෙහි ප්‍රකාශිතව සඳහන් කර ඇති කරුණු හැර, වාණිජකරු විසින් බැංකුව විසින් හෝ බැංකුව වෙනුවෙන් කරන ලද යම් නිරූපණ ප්‍රකාශයක් හෝ වගකීමක් (ලිඛිත හෝ වාචික හෝ ප්‍රකාශිත හෝ අඟවනු ලැබූ) මත විශ්වාසය තබා ඔහු විසින් මෙම ගිවිසුම වෙත ඇතුළු නොවූ බවට වාණිජකරු විසින් පිළිගෙන එකඟ වේ.

**33. ඉවත් කිරීම**

මෙම ගිවිසුමෙහි කොන්දේසි හෝ නියමයන් එකක් හෝ කිහිපයක්, ඕනෑම අවස්ථාවකදී ඕනෑම කාලපරිච්ඡේදයක් සඳහා බලාත්මක කිරීමට බැංකුව අපොහොසත් වීම, මෙම ගිවිසුමෙහි අනෙකුත් කොන්දේසි හා නියමයන් බලාත්මක කිරීම නවතා දැමීමක් නොවනු ඇත.

**34. තහනම් කරන ලද සේවා සම්පාදන කාණ්ඩයන්**

34.1 පහත සඳහන් කරුණු යටතේ පවතින සේවා සම්පාදන ආයතනයක්, තහනම් කරන ලද සේවා සම්පාදන ආයතන කාණ්ඩයක් තුළ ක්‍රියාත්මක වන බවට සලකනු ලැබේ.

a. කූඨ හෝ කොල්ලකාරී ක්‍රමවේදයන් භාවිතයෙන් භාණ්ඩ හෝ සේවාවන් විකුණනු ලබයි නම් සහ / හෝ ඕනෑම සහභාගිවන්නකු, සේවා ආයතන, කාඩ්පත් හිමිකරු, කාඩ්පත් නිකුත්කරන්නා සඳහා ඇති අවශ්‍යතාවන් උල්ලංඝනය කිරීම සහ කූඨ ක්‍රියාවන් තහනම් කරන නීති ඇතුලත්ව ගණිකා වෘත්තීය, කාමුක දර්ශන සහිත භාණ්ඩ හෝ සේවාවන් අලෙවියට හෝ ව්‍යාජ භාණ්ඩ (පහත අර්ථකථනය කර ඇති ආකාරයට) අලෙවියට සම්බන්ධ හෝ එසේ නොවන වුවද අනුකරණය කරනු ලබන නිෂ්පාදන හෝ භාණ්ඩ, සත්‍ය භාණ්ඩ ලෙස විකිණීම. "ව්‍යාජ භාණ්ඩ" යන්නෙන් අනුකරණය කරන ලද නිෂ්පාදන හෝ භාණ්ඩ අව්‍යාජ භාණ්ඩ ලෙස විකිණීමේ අභිප්‍රාය සහිතව වංචනික ලෙස හෝ අදාළ වෙළෙඳ සලකුණ, පේටන්ට් බලපත්‍රය හෝ ප්‍රකාශන හිමිකම් නීති යටතේ පවතින ආරක්ෂාව උල්ලංඝනය කරමින් නිෂ්පාදන කරනු ලැබූ නිෂ්පාදන හෝ භාණ්ඩ අදහස් වේ.

b. ළමා කාමුක දර්ශන සහ මිනිස් ජාවාරම් සහ සූරා කෑම් හා අදාළ සෘජු හෝ වක්‍රව විකුණුම් සහ / හෝ බෙදා හැරීම් සඳහා පහසුම් සපයන ඕනෑම ක්‍රියාකාරකමක් හෝ සේවාවක්

c. වඳවීමේ තර්ජනයට ලක්ව ඇති විශේෂ හෝ ඒවායේ නිෂ්පාදනවලින් සමන්විත ඕනෑම භාණ්ඩ හෝ නිෂ්පාදන විකිණීම. (වඳවීමේ තර්ජනයට ලක්ව ඇති විශේෂවල ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ සම්මුතියෙහි ඕනෑම උප ග්‍රන්ථයක ඇතුලත් කර ඇති ඕනෑම වඳ වීමේ තර්ජනයට ලක්වී ඇති විශේෂයක්)

d. "සේවා සම්පාදන ආයතනය" සඳහා වන අර්ථ දැක්වීමට හෝ කාඩ්පත් පිළිගැනීම පාලනය කරනු ලබන නියමයන්ට අනුකූල නොවන ආයතන; සහභාගිවන්නා සඳහා නම්කරන ලද බලයලත් අධිකරණ බල සීමාවෙන් පිටත ක්‍රියාත්මක වන ආයතන; කාඩ්පත් නිකුත්කරන්නා සතු පිළිගැනීමේ තත්ත්වය සඳහා බලපෑමක් ඇති කළ හැකි හෝ අහිතකර, පාඩු, ප්‍රතිචාර අත්විඳීමට හේතු විය හැකි ආයතන ඇතුළුව, කාඩ්පත භාර ගැනීම නුසුදුසු බවට කාඩ්පත් නිකුත් කරන්නා විසින් නම් කරන ලද සේවා ආයතන කාණ්ඩයක් තුළ භාණ්ඩ හෝ සේවාවක් පිරිනැමීම හෝ විකිණීම හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යන හෝ ක්‍රියාත්මක කරන ආයතන

e. එසේ නොමැති නම්, නෛතික අවශ්‍යතාවන්, යටතේ බලය පැවරීම් සහ / හෝ පිටවීම සිදු කිරීමට පුද්ගලයෙකු විසින් හෝ සහභාගිවන්නන්ගේ බලය ලත් අධිකරණ බල සීමාව තුළ හෝ ඒ තුළ ගනුදෙනුව සිදුවන ස්ථානය, පිළිගනු ලබන ස්ථානය කාඩ්පත්හිමියා සහ / හෝ කාඩ්පත් නිකුත් කරන්නා විසින් තහනම් කරනු ලැබූ ආකාරයේ නීති විරෝධී ගනුදෙනු සඳහා සම්බන්ධ වීම්.

34.2 කිසියම් නව තහනම් ආයතන කාණ්ඩයක් බැංකුව / කාඩ්පත් නිකුත් කරන්නා /සම්බන්ධිත හවුල්කරුවන් / ලියාපදිංචි මූල්‍ය හෝ ඒ හා සමාන ආයතන විසින් නියම කරනු ලැබුවහොත්, වාණිජකරු විසින් වරින් වර එවැනි තහනම් ආයතන කාණ්ඩ පිළිබඳ නිසි පරිදි යාවත්කාලීන විය යුතුය.

34.3 වාණිජකරු විසින් බැංකුව, කාඩ්පත් නිකුත් කරන්නා / ඒ හා සම්බන්ධ හවුල්කරුවන් / ලියාපදිංචි මූල්‍ය ආයතන හෝ ඒ හා සමාන ආයතන විසින් මෙහි ඉහත සඳහන් කර ඇති සහ / හෝ කලින් කලට තහනම් ලෙස හඳුන්වා දෙනු ලබන ඕනෑම තහනම් ආයතන කාණ්ඩයකට හවුල් වීම සහ / හෝ ඒවායෙහි ක්‍රියාත්මක වීම නොකළ යුතුය.

34.4 කාඩ්පත් අත්කර ගනු ලබන්නා, කාඩ්පත් නිකුත් කරනා විසින් ඔවුන්ගේ අභිමතය පරිදි සේවා ආයතනයක් මෙහි දක්වා ඇති අවශ්‍යතාවන්ට අනුකූලව ක්‍රියාකරයිද යන්න තීරණය කළ හැක.

**35. පොදු**

35.1 මෙම ගිවිසුමෙහි ඕනෑම විධිවිධානයක් ඕනෑම පනතක් හෝ නීතියේ ආධිපත්‍යයක් යටතේ සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් ලෙස නීති විරෝධී, අවලංගු හෝ බලාත්මක කළ නොහැකි වන්නේ නම් හෝ එසේ වන බවට ඔප්පු කළ හැකි නම්, එවැනි විධි විධානයන් හෝ කොටසක් මෙම ගිවිසුමෙන් ඉවත් කරන ලද බවට සලකනු ලබන අතර මෙම ගිවිසුමෙහි ඉතිරි විධි විධානවල නීත්‍යනුකූලභාවය, වලංගුභාවය සහ බලාත්මක කිරීමේ හැකියාව කිසිඳු අයුරකින් එමගින් බලපෑමට ලක් නොවේ.

35.2 එක් පාර්ශ්වයක් මගින් අනෙක් පාර්ශ්වය වෙත සිදු කරනු ලබන දැනුම් දීම් හෝ සන්නිවේදනයන් ලිඛිතව ලබාදිය යුතු අතර, ඒවා පුද්ගලිකව ගෙනවිත් භාරදීම හෝ පෙර ගෙවුම් ලියාපදිංචි තැපෑල මගින් අනෙක් පාර්ශ්වය නමින් ඉහත සඳහන් කර ඇති ඊට අදාළ ලිපිනය වෙත හෝ යම් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වය වෙත විශේෂයෙන් සඳහන් කරනු ලැබූ එවැනි වෙනත් ලිපිනයක් වෙත එවනු ලැබුවේ නම්, එය සම්පූර්ණ වශයෙන් ලබාදී ඇති බවට සලකනු ලැබේ.

35.3 තම ලිපිනය, තත්ත්වය, සම්බන්ධතා තොරතුරු හෝ වෙත තොරතුරුවල යම් වෙනසක් සිදුවේ නම්, වාණිජකරු විසින් එම වෙනස් වීමට දින තිහකට (30) පෙර ඒ බව බැංකුව වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

35.4 මෙම කොන්දේසි හා නියමයන් සංශෝධනය කිරීමට බැංකුව වෙත සෑමවිටම අයිතිය ඇති බවට වාණිජකරු විසින් එකඟ වන අතර, වාණිජකරුවන් සඳහා වන කොන්දේසි හා නියමයන්හි වඩාත් යාවත්කාලීන කරන ලද අනුවාදය අඅඅගජරටසකකිඉඛනගජදප වෙබ් අඩවියෙහි "කාඩ්පත්" යටතේ (වෙළෙඳසැල් හිමියන් සඳහා වන ගිවිසුම වෙත පිවිසෙන්න) ඇතුලත් කර ඇත. එවැනි සංශෝධන හෝ නව කොන්දේසි හඳුන්වාදීම් පිළිබඳ වාණිජකරු වෙත දැනුම්දීමත් සමග, ඒවා වෙත වාණිජකරු බැඳී සිටී.

**36. ගිවිසුමෙහි වෙනස් වීම්**

ඕනෑම අවස්ථාවකදී මෙම කොන්දේසි හා නියමයන් වෙනස් කිරීමේ හෝ සංශෝධනය කිරීමේ අයිතිය බැංකුව රඳවා ගනු ලැබේ. එවැනි වෙනස් කිරීමක් හෝ සංශෝධනය කිරීමක් හෝ හඳුන්වා දීමක් පිළිබඳ වාණිජකරු සාමාන්‍ය තැපෑල මගින් දැනුවත් කරනු ලැබූ අවස්ථාවේ සිට එම කරුණු බලපැවැත්වෙනු ඇති අතර, ඒ සමග බැඳී පවතී. වාණිජකරු විසින් එම වෙනස් කිරීම හෝ සංශෝධනයන් හෝ හඳුන්වාදීම් සඳහා එකඟ නොවන්නේ නම්, බැංකුව මගින් අදාළ දැනුවත්කිරීම ලැබී දින පහක් (5) ඇතුලත ලියාපදිංචි තැපෑල හරහා බැංකුව වෙත දැනුම් දිය යුතුය. බැංකුව විසින් තැපෑල හරහා වාණිජකරු වෙත එවනු ලැබූ දැනුවත් කිරීමක්, එය තැපෑල වෙත භාර දීමෙන් පසු දිනයේදී වාණිජකරු වෙත හිමි වූ බවට සලකනු ලැබේ.

**37. පාලන නීති රීති**

මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව පාලනය හා ක්‍රියාත්මක විය යුතුය.

**මෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් සාක්ෂි සඳහා පාර්ශ්වයන් මෙහිද, මේ හා සමාන තවත් ලේඛනයකද මෙහි සඳහන් ස්ථානයේදී හා දිනදී ස්වකීය අත්සන් තබන ලදී.**

## ඉහත සඳහන් නියමයන් සහ කොන්දේසි මා / අප හොඳින් කියවා තේරුම් ගන්නා ලදී.

| | | |
|---|---|---|
| වාණිජකරුගේ අංකය | | |
| ණය සීමාව | දේශීය | |
| | ජාත්‍යන්තර | |

**(කරුණාකර තෝරාගන්නා යෝග්‍ය සැලසුම ඉදිරියෙන් හරි සළකුණ යොදන්න. )**

| ගෙවීමේ සැලැස්ම | | වට්ටම් අනුපාතය |
|---|---|---|
| පසු දින ගෙවීමේ සැලසුම | ☐ | |
| දින තුනක් ඇතුලත ගෙවීමේ සැලසුම | ☐ | |
| දීර්ඝ කරන ලද ගෙවීමේ සැලසුම | ☐ | |

----------------------------------------------------------------------

**ව්‍යාපාරයේ නම**

----------------------------------------------------------------------

**බලයලත් අත්සන්කරුගේ නම සහ තනතුර (කරුණාකර මුද්‍රණය කරන්න)**

**නෙරා ඇති මුද්‍රාව / රබර් මුද්‍රාව මත බලයලත් පුද්ගලයාගේ අත්සන**

**සීමාසහිත කාගිල්ස් බැංකුව සඳහා හා ඒ වෙනුවෙන්**

**දිනය**

--------------------------

කාගිල්ස් බැංකුව ශ්‍රී ලංකා මහා බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.